# 2023 පෙබරවාරි 21 වන දින
# බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ 2023 පෙබරවාරි මාසයට
# අදාළව පැවැති හයවන මහා සභා වාරයේ
# 57 වන මහා සභා රැස්වීම් වාර්තාව.

**පැමිණීම**

| | |
|---|---|
| 01. ගරු සභාපති | - සිරිල් මුණසිංහ මහතා |
| 02. ගරු උප සභාපති | - එම්.ජී.විරාජ් ලලන්ත ගලප්පත්ති මහතා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එච්.ජී.දිනේෂ් අනුරුද්ධ මහතා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පී.ජී.ජී.හෙලන් පුෂ්ප කුමාර මහතා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - වී.පි.තිලක් කුමාර මහතා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එන්.පී.ජී. පියරත්න මහතා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - දයාරත්න ගුණවර්ධන මහතා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - විදාන ආරච්චිගේ උදය කුමාර මහතා |
| 09. .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ප්‍රසාද් චින්තක රණමුක මහතා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ඒ.ජී.ප්‍රභාත් චන්ද්‍ර කුමාර මහතා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - කේ.පී.ශාන්ත මහතා |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පී.කේ.අතුල සම්පත් මහතා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ඩී.අමල් ඉන්දික මහතා |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එස්.ඩබ්.උදේශිකා හර්ෂනී මහත්මිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - බැදිගම පතිරණගේ ලසන්ත මහතා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - බී. චමිල ප්‍රේමනාත් මහතා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - මානවඩුගේ කැලුම් ජානක මහතා |
| 20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ඩබ්.ඒ.රසිකා වික්‍රමසිංහ මහත්මිය |
| 21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - මනෝජ් ලසන්ත විදානගම මහතා |
| 22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | -රෝහිනී බණ්ඩාර මහත්මිය |
| 23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ඩබ්.ඒ.ටී.සී.වෙදආරච්චි මහතා |

**නොපැමිණීම**

| | |
|---|---|
| 24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - කේ.ඒ. ශ්‍රියානි මහත්මිය |
| 25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එම්.එච්.රමාලතා ද සිල්වා මහතා |
| 26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ඒ. දිල්ෂි රම්ෂිමා ගුණතිලක මහත්මිය |

**01. පිළිගැනීම.**.

2023 පෙබරවාරි මාසයට අදාලව පවත්වනු ලබන මහා සභා රැස්වීමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා, ජනමාධ්‍යවේදින් සහ බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් මහතා හා සභාය නිලධාරීන් ඇතුළු සියළු දෙනා ඉතා ගෞරවයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා සභාවේ කටයුතු ආරම්භ කළේය.

**02. ආගම සිහි කිරීම සහ ජාතික ගීය ගායනා කිරීම**

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින සියළු දෙනා අමතා ආගම සිහි කිරීමටත්, ජාතික ගීය ගායනා කිරීමටත් ජාතියට ගෞරව කිරීමටත් කර ආරාධනාව අනුව සියළුදෙනා එක්ව ආගම සිහි කිරීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කර ජාතියට ගෞරව කරන ලදි.

**03. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම ( සංශෝධනයන්ට යටත්ව)**

2023 ජනවාරි මාසයට අදාළව, 2023 ජනවාරි 16 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව නියමිත දිනයට ප්‍රථම ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා වෙත ලැබීමට සලස්වා ඇති හෙයින්, එම වාර්තාව සභාව හමුවේ කියවූ වාර්තාවක් සේ සලකා සම්මත කළ යුතු බවත්, එම මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස නිවැරදි කිරීම් හා සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පි.තිලක් කුමාර මහතා යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පි.තිලක් කුමාර මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ජී.හෙලන් පුෂ්ප කුමාර මහතා විසින් ස්ථිර කරන බව ප්‍රකාශ කරන ලදි.

ඉන් අනතුරුව ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා ප්‍රකාශ කරන ලද්දේ, 2023 ජනවාරි 16 දිනැති සභා වාර්තාවේ නිවැරදි කිරීම් හෝ විරෝධතාවයන් ඇත්නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසී ඇති බවයි.

__නිවැරදි කිරීම් -__

1. __ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා__
   පසුගිය සභා වාර්තාවේ පිටු අංක 10 හි මා විසින් සිදුකරන ලද ප්‍රකාශයේ "දින හතරකට" පෙර යන්න "දින හතකට" පෙර ලෙස සංශෝධනය විය යුතුය.

**04.** __ගරු සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදන හා පසුගිය සභා වාර්තාවේ ප්‍රගතිය විමර්ශනය කිරීම.__

__04(I). පළාත් පාලන ආයතනවල සභික ධූරය අවසන් කිරීම පිළිබඳ ගැසට් නිවේදනය__

__ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා__
පළාත් පත් පාලන ආයතනවල සභික ධූරය අවසන් කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.01.23 දිනැති හා 2316/02 ගැසට් පත්‍රය ප්‍රකාරව බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන මීගස්දෙනිය කංකානම්ගේ ප්‍රබෝධිත් ධර්මාජීව මහතා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභික ධූරයට ඔහු විසින් අතහැර ඇති බව මෙම ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශ කර ඇත.

__ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා__
පසුගිය දිනවල දී බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස විශාල සොරකමක් කළ බවට ලංකාවේ පමණක් නොව මුළු ලෝකය පුරාම ජනමාධ්‍ය හරහා ප්‍රචාරය වුණා. මාධ්‍ය මගින් හා අදාල පොලිසිය මගින් මෙය සොරකමක් ලෙස අර්ථ දක්වා ඇති නිසා ඔබතුමන්ලාටත් එය පිළිගැනීමට සිදු වුණා. මහහීල්ල පැරකුම් ප්‍රජා මූල සංවිධානය මා භාර ගත්තේ ගම ගැන සිතලා. වර්තමානයේ තිබෙන නව විදුලි ගාස්තු සමඟ මේ සංවිධානයේ විදුලි බිල රුපියල් ලක්ෂ 5 කට ආසන්න වුණා. මෙය ගෙවා ගැනීමට නොහැකි තත්ත්වයක තමයි සමිතිය තිබුණේ.

ගරු ඩී. වී. උපුල් මැතිතුමා මෙම ප්‍රජාමූල සංවිධානයට රුපියල් ලක්ෂ හතළිහකට ආසන්න මුදලක් වෙන් කරන තිබුණා. නමුත් මේ මුදල් ජල සම්පාදන දෙපාර්තමේන්තුව හරහා කොළඹට ගිහින් තමයි මෙහෙට ලැබෙන්නේ. ඒ සඳහා විශාල කාලයක් ගතවන නිසා මේ සංවිධානයට තිබූ මුදල් ලක්ෂ දහයකට ආසන්න මුදලක් යොදවලා මෙම ජල ව්‍යාපෘතිය අලුත්වැඩියා කිරීම් සිදුකලා. ගැටමාන්න ජනතාවට මහහීල්ලෙන් ජලය ලබා දෙන්න නොහැකි වුණත් මම ඒ සඳහා මැදිහත් වෙලා ඒ තුලින් මහහීල්ල ප්‍රජා ජල ව්‍යාපෘතියෙන් ගැටමාන්න ජනතාවට ජලය ලබා දුන්නා. මෙහිදී රුපියල් ලක්ෂ 5 කට ආසන්න බිලක් ජල පාරිභෝගිකයින්ගෙන් අපට ලැබීමට තිබුණත් එය අපට ලබාගන්නට බැරි වුණා.එම නිසා මෙම විදුල බිල අපට ගෙවා ගැනීමට නොහැකි වුණා.

එම නිසා විදුලි ඉංජිනේරු, තංගල්ල යන ලිපිනයට 2021/11/21 දිනැතිව ලිපියක් මා විසින් යොමු කළා. එහි සඳහන් වූයේ අපට අය වීමට ඇති ජල බිල්පත් ලැබීමෙන් පසු කඩිනමින් විදුලිය බිල්පත් ගෙවන බවත්, ඒ වන තුරු විදුලිය විසන්ධි නොකරන ලෙසත්ය. නමුත් ඔවුන් විසින් විදුලිය විසන්ධි කිරීම සිදුකලා. එහිදී මා විසින් පුද්ගලිකවම රුපියල් රු.250,000.00 ක ණය මුදලක් ගෙන මෙම විදුලි බිල්පත ගෙවා නැවතත් මෙම සංවිධානයට විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කලා.

පැරකුම් ප්‍රජා මූල සංවිධානයට අඟල් 2 හි ගැල්වනයිස් බට 19ක් ලැබිලා තිබුණා. ඒ අනුව මෙම නල තොගය විකුණා අදාල විදුලි බිල්පත ගෙවා දැමීම සඳහා අනුමැතිය ලබා ගැනීමට මා විසින් ස්ථාන භාර නිලධාරී, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව තංගල්ල යන ලිපිනයෙන් එතුමාගෙන් ඉල්ලීමක් සිදු කළා. ඒ අනුව එම ලිපියට පිළිතුරක් වශයෙන් මෙම නල තොගය විකුණා අදාල විදුලි බිල ගෙවා දැමීමට ඔවුන් අවසර ලබා දුන්නා.

නමුත් මේ ලිපි එහා මෙහා හුවමාරු වී තිබුණත් බෙලිඅත්ත පොලිසිය විසින් බී වාර්තාවක් නිකුත් කර මෙය සොරකමක් ලෙස අර්ථ ගන්වා මා උසාවියට රැගෙන ගොස් සිරගත කළා. ජනතා විමුක්ති පෙරමුණ රුස්වීම සඳහා මෙම වාහන නැවතුම් අංගනය පසුගිය දිනවලදී මා ලබාදීමත් මගේ සිරගතවීම් වලට බලපැවායි මා සිතනවා. මේ සිදුවීමේදී දේශපාලනමය වශයෙන් මට විශාල අසාධාරණයක් වුණා. නමුත් තව නඩු වාර දෙකක් තුනක් යද්දි මෙම නඩුව අවසන් වෙනවා. ඉන්පසු මේ අයට විරුද්ධව මම නඩුවක් දැමීමට සූදානමින් සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා**

සභාපතිතුමාගේ අනුමැතිය යටතේ තමයි මම මේ ගැන කතා කරන්නේ. මේ සභා ගොඩනැගිල්ල, එහි තිබෙන බඩුබාහිරාදිය, මේ හිස් භූමිය අපි කාගෙවත් දේපල නෙමෙයි. මේවා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව සතු දේපළ. බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් සකස් කරන ලද නෛතික තත්වයක් යටතේ මෙම දේපල භාවිතා කිරීමේ අයිතිය මේ රටේ සෑම පුරවැසියෙකුටම තිබෙනවා. එම නිසා අපගේ ජාතික ජන බලවේගයේ රැස්වීම මෙම භූමිය තුල ගැනීම මේ ගැටලුවට බලපාල තිබෙනවා නම් එය කිසිසේත්ම විය නොහැකි කාරණයක්. ඒක වැරදි කථාවක්. ඒක නිවැරදි කළ යුතුයි. මෙම භූමියේ රැස්වීම් තැබීම සඳහා වෙන් කර ගැනීමට ඕනෑම පුද්ගලයෙකුට හැකියාවක් තිබෙනවා. මම මේ භූමිය රැස්වීම පැවැත්වීම සඳහා යොදා ගත්තේ සියලුම නීතිමය තත්වයන් යටතේ අදාළ මුදල් ගෙවලා.

ඔබතුමාට පසුගිය දිනවල දී යම් ප්‍රශ්නයක් ආවා. එයට අදාළ සිදුවීම සිදුවූයේ රාත්‍රී කාලයේ දීය. මෙහි ඇති විනිවිද භාවය සම්බන්ධයෙන් මම දන්නේ නැහැ. ඔබතුමා මෙයට අදාලව ලිපි ගොනුවක් ඉදිරිපත් කළා. නමුත් එම ලිපි කවර ආකාරයට, කවර දින කාල වකවානුවලදී සකස් වූවා ද යන්න පිළිබඳව මට අවබෝධයක් නැහැ.ඒ වගේම මේ ගැල්වනයිස් බටවල නීතියානුකූල තත්ත්වය පිළිබඳවත් මට අවබෝධයක් නැහැ. මෙම ගැටළුවේදී මමත් බෙලිඅත්ත පොලිසියට ගියා. එහිදී මෙම ගැටලුවට සම්බන්ධ පාර්ශව වලින් මම විමසීමක් කළා. එහිදී ඔවුන් මට බිලක් පෙන්වූවා. එහි සඳහන් වන්නේ ගාල්ල සෙලාන් බැංකුවට, යසස් ජයසේන නමැති අයට රුපියල් 255,000.00 ක මුදලක් තැන්පත් කර ඇති බවයි. මෙම බිල්පත් ඉදිරිපත් කිරීමත් මේ ගැටලුව සඳහායම් ආකාරයකට බලපෑවා යැයි මට සිතෙනවා. අපට මේ සභාවේ සිටින කිසිදු පුද්ගලයෙක් සමග පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. නමුත් අපට තිබෙන දේශපාලනික ප්‍රශ්න දේශපාලනිකව විසඳා ගැනීමට අප උත්සාහ ගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා**

මහහිල්ල ප්‍රජා ජල මූල සංවිධානයේ මමත් ජල පාරිභෝගිකයෙක්. මෙම ගැටලුවේ ආරම්භක අවස්ථාවේදී මමත් එහි සිටියා. ඒ අනුව මෙම ගැටළුව විවිධ අරමුණු ඔස්සේ ගමන් කර ඇති බව මට අවබෝධ වුණා. එතන අඩුපාඩු ගොඩක් තිබුණා. එතනදී මේ සම්බන්ධයෙන් කාරක සභා වාර්තාවක් ඉදිරිපත් කිරීමට තිබූ බවත් මම සභාපතිවරයාට දැනුම් දුන්නා. එසේ වුණානම් ඔබතුමාට ඇප ලබා ගැනීමේදී ගැටලුවක් මතු නොවේවියැයි මට සිතෙනවා. මේ ගැටලුව පවුල් ආරවුලක් මත ගොඩනැගුනු ගැටළුවක්. මේ සමිතියෙ සිටින සාමාජිකයන්ට මෙම සමිතිය විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යන්න නොහැකි වෙලා තිබෙනවා. නමුත් සමිතියෙ ගැටළු විධිමත් ආකාරයකට විසඳ ගන්නේ නැතිව පෞද්ගලික පළිගැනීම සඳහා මේ සමිතියේ දේපළ යොදා ගැනීම, පොලිසි උසාවි ගෙන ඒම ඉතාමත් වැරදියි.

අදාළ පැමිණිලිකරුට පොහොට්ටුවේ නාමයෝජනා ලබා දීම තුලින් එය පැහැදිලි වෙනවා. මිනිස්සු මෙහි යථාර්ථය දන්නේ නැහැ. මෙයින් පැහැදිලි වන්නේ රාජපක්ෂවරුන්ගේ තත්ත්වයයි. මේ නායකයින් මහහිල්ලට කිසිසේත්ම සුදුසු නැහැ. හරිදේට හරි කියන්නත් වැරදි දෙයට වැරදි කියන්නත් මා පසුබට වන්නේ නැහැ.

ඒ වගේම පසුගිය සමිති වාරයේ තිලක් මන්ත්‍රීවරයා විසින් වතුර ටැංකියක් සම්බන්ධයෙන් ගැටලුවක් මතු කළා. එහි වර්තමාන තත්ත්වය පිළිබඳවත් මා දැන ගැනීමට කැමතියි.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

පැරකුම් ප්‍රජා මූල සංවිධානයේ භාණ්ඩාගාරිකවරයා ඉල්ලා අස්වෙලා තිබෙනවා. ඒ නිසා මෙම ගිණුමට මුදල් දැමුවහොත් එය මාරු කර ගැනීමේදී ප්‍රශ්නයක් ඇතිවෙනවා. එම නිසා අපට මුදල් මාරු කිරීමට ක්‍රමයක් තිබුණනේ නැහැ. මගේ ගිණුම ඕඩී වෙලා තිබුනේ. එම නිසා මගේ ළඟින් සිටින මගේ පුතාගෙන් මම ගිණුම් අංකය ඉල්ලා සිටියත් ඔහු විසින් ලබාදී තිබුණේ ඔහුගේ බිරිඳගේ ගිණුම් අංකයයි. නමුත් මෙම මුදල් ගිණුමට වැටීමටත් පෙර මම විදුලි බිල සඳහා මුදල් බැඳලා තිබුණේ. මුදල් ලබා ගැනීමේදී යම් ගැටලුවක් තිබුණත් එය නීතිය ඉදිරියේ ගැටලුවක් නොවෙයි කියා මා සිතනවා. ඒ වගේම මහින්ද රාජපක්ෂ මැතිතුමා මට කිසිම අඩුපාඩුවක් කරලා නැහැ.

මේ ටැංකිය ප්‍රශ්නයේදී තිලක් මන්ත්‍රීවරයා මගෙන් ටැංකියක් ඉල්ලා සිටියා. ඉන් පසුව අදාල නිලධාරීන් විසින් නීතිරීතිවලට අනුව ලිපි ලේඛන වල අත්සන් කරලා තමයි තිලක් මන්ත්‍රීවරයාට මෙම ටැංකිය ලබා දුන්නේ. පසුගිය දිනවලදී නිලධාරීන් විසින් මේ ටැංකිය ගැන සොයා බැලීමේදී තමයි මේ ටැංකිය එම ස්ථානයේ නොමැති බව දැනගන්නට ලැබුණේ. මන්ත්‍රීවරයාගෙන් මේ පිළිබඳව විමසා සිටියත් ඔහු කිව්වේ ටැංකිය එම ස්ථානයෙන් රැගෙන ගොස් ඇති බවයි. කෘෂ කැබ් රථය පැමිණ මෙම ටැංකිය රැගෙන ගොස් ඇති බව කියා සිටියත් එම වාහනයට එය පැටවීම සඳහා පුද්ගලයින් හතර පස් දෙනෙක්ම අවශ්‍යා වෙනවා. ඒ වගේම මේ ටැංකිය තියෙන ස්ථානය වටේට ගෙවල් පහ හයක් තිබෙනවා. එම නිසා මේ ටැංකිය එහි සිටින පුද්ගලයින්ට නොපෙනෙන ආකාරයට ගෙනෙන්නට බැහැ. අපි මේ සම්බන්ධයෙන් තිලක් මන්ත්‍රීවරයා සමඟ සාකච්ඡා කරලා තීන්දුවක් ගනිමු.

## 05. ප්‍රාදේශීය සභාව අමතා එවා ඇති ලිපි, පෙත්සම්, සංදේශ, පැමිණිලි හා සන්නිවේදන

### 05(I). ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් බෙලිඅත්ත ලුණු කඩේ හංදිය ඉඩම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් එවා ඇති ලිපිය

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය බෙලිඅත්ත ශාඛාවේ කළමනාකරු විසින් අපට ලිපියක් යොමු කරලා තිබෙනවා. එහි සඳහන් වන්නේ අංක 1406 සහ 2021.08.05 වන දින දරන සැලැස්ම සඳහා අප ආයතනය අනුමැතිය ලබා දී ඇති බැවින් එකී සැලැස්ම අප වෙත භාර දෙන ලෙසත්, එම ඉඩම බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම පිළිබඳව මහා සභා වාරයේදී ගනු ලැබූ තීරණය සම්බන්ධයෙන් වන වර්තමාන තත්ත්වය පිළිබඳව ලිඛිතව ඔවුන්ට දන්වා සිටින ලෙස මෙම ලිපිය මගින් ඔවුන් ඉල්ලා සිටිනවා.

මෙම ඉඩම් කැබැල්ල බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට විසින් අත්පත් කර ගත්තත්, නැතත් එහි ඉඩම් සැලසුම අනුමත කිරීමේ ගැටලුවක් නැහැ. අප මේ වන විටත්එය අනුමත කරලා තියෙන්නේ. ඒ වගේම මෙම ඉඩම අත්පත් කර ගැනීමේ යෝජනාව මීට ඉහත දී සභා සම්මත වෙලා ඒ සඳහා අදාල වැඩ කටයුතු සිදුවෙමින් පවතිනවා. නමුත් ඔබතුමන්ලා අද මෙය අත්පත් කරගන්න එපා කියනවා නම් එය ඉතාමත් අපරාදයක්. මෙම ඉඩම බෙලිඅත්ත ජනතාවට ඔවුන්ගේ පොදු කටයුතු සඳහා ඉතාමත් වටින ඉඩමක්. මෙම ඉඩම අත්පත්කර ගැනීමට අවශ්‍ය මුදල් මාස තුනක් ඇතුළත දේශීය ණය සංවර්ධන අරමුදල මගින් අපට ලබා ගැනීමට හැකියාව තිබෙනවා. මෙහි තක්සේරුවක් ලැබිලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී මම කතා කළා. එහිදී මෙය අත්පත් කර ගැනීමට කැමැත්ත ප්‍රකාශ වුණා. එම නිසා මෙම අත්පත් කර ගන්නවාද නැද්ද යන්න පිළිබඳව ඔබතුමාගේ අදහස්_දක්වන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විදාන ආරච්චිගේ උදය කුමාර මහතා**

මටත් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලිපියක් ලැබුණා. නමුත් මේ ලිපියේ ආමන්ත්‍රණය කිරීමේ ගැටලුවක් තිබෙනවා.ඒ වගේම මෙම ලිපියෙන් මේ කාරණාව ගැන අවබෝධයක් ලබා ගැනීමටත් අපහසුයි.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියන්නේ තවමත් ඉතාමත් දැවැන්ත පක්ෂයක්. අපි ඔබතුමන්ගේ සහයෝගය සමඟ ගමට විශාල වැඩ කොටසක් ඉටු කරලා තිබෙනවා. අපි ඡන්දයකට යන්න භය නැහැ. හෙට මැතිවරණය පවත්වන ලෙසට හෙට දිනයේ උද්සෝෂණය පැවැත්වුවහොත් මම එම උද්සෝෂණයේ පොහොට්ටුවේ සාමාජිකයෙකු ලෙස ඉදිරියෙන්ම ගමන් කරනවා. අපිටත් මේ ඡන්දය ඉතාමත් අවශ්‍යයි. . . ඡන්දය මාර්තු 09 වන දිනට පවත්වන ලෙසට මේ සභාව විසින් යෝජනාවක් ගෙන එන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා**

මටත් රක්ෂණ සංස්ථාවෙන් මෙම ලිපිය ආවා. මීට ඉහත සභා වාරයකදී මෙම ලුණු කඩේ හන්දියේ ඉඩම සභාවට අත්පත් කරගැනීමට යෝජනාවි සභා අනුමැතිය ලැබුණා. මෙය සභාපතිවරයා විසින් සත් භාවයෙන් කළ යෝජනාවක් වුවත් මෙහි පිටුපස ඉන්ධන පිරවුම්හලක් දැමීම සඳහා පුද්ගලයකුට බදු දීමට ඇති බවට තොරතුරු අනාවරණය වෙලා තිබෙනවා. මෙම ඉඩම සභාවට ඉතාමත් වටිනා දේපලක් නිසා මෙම ඉඩම සභාවට අත්පත් කරගන්නවා නම් එහි සිදු කරන්නේ කුමක්ද යන්න පිළිබඳවත් අපි මෙහිදී අනිවාර්යෙන්ම එකඟතාවයකට පැමිණිය යුතුයි. එසේ නොවුණහොත් මෙය පුද්ගලයින්ගේ, දේශපාලනිකමය අවශ්‍යතාවලට අනුව අලෙවි වීමට ඉඩ තිබෙනවා. එම නිසා මෙය සභාවට අත්පත්කර ගන්නවා නම් සත්‍ය වශයෙන් එහි අවශ්‍යතාවය හඳුනාගෙන එහි සිදු කළ යුතු දේ පිළිබඳ අපි එකඟතාවයකට පැමිණිය යුතුයි.

මෙම රක්ෂණ සංස්ථාව බෙලිඅත්ත නගරයේ පිහිටුවලා දැනට වසර හතළිහකට ආසන්න කාලයක් ගත වෙනවා. මෙම ඉඩම අත්පත් කර ගැනීමටත් එහි ඉදිකිරීම් කටයුතු කිරීමටත් ප්‍රාදේශීය සභාවට විශාල මුදලක් අවශ්‍ය වෙනවා. නමුත් එය ඉටුකර ගැනීමට අවස්ථාව තිබෙනවා නම් ඉතාමත් හොඳයි. එසේම මම තවත් යෝජනාවක් ගෙන එන්නට කැමතියි. රක්ෂණ සංස්ථාව සමඟ අප ගිවිසුම්ගත වෙලා ඔවුන් සමග එකතුවෙලා ණයක් ලබා නොගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකි නම් එය ඉතාමත් වටිනවා. මේ යෝජනාවත් මම මෙයට එකතු කරන්නට කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා**

මටත් මේ සම්බන්ධයෙන් ලිපියක් ලැබිලා තිබෙනවා. බෙලිඅත්ත නගරයට හිස් භූමියක අවශ්‍යතාවය ඉතාමත් දැඩිව දැනිලා තිබෙනවා.මයුර මන්ත්‍රීතුමාට ලද ආරංචි මටත් ලැබුණා. මට ලැබුන ආරංචියට අනුව මෙම ඉඩම සභාවට අත්පත්කරගන්නේ විරාජ් උප සභාපතිතුමාට ෂෙඩ් එකක් දැමීම සඳහාය. මෙහි ඇති සත්‍ය අසත්‍යතාවය පිළිබඳව මම දන්නේ නැහැ. සභාවට මෙම ඉඩමේ අවශ්‍යතාවය දැඩිව දැනිලා තිබෙනවා.

ඒ වගේම රක්ෂණ සංස්ථාවටත්, ඔවුන්ගේ කාර්යාලය පවත්වාගෙන යාමට ඉඩ කඩක් නොමැති ප්‍රශ්නයක් තිබෙනවා. මේ සඳහා අපට විකල්ප තීරණ කිහිපයක්ම ගැනීමට හැකියාව තිබෙනවා. ඉන් එක් විකල්පයක් වන්නේ සභාවේ තිබෙන ඉඩම් වලින් එකක් ඔවුන්ට ලබාදීමයි. අනික මේ බෙලිඅත්ත නගරයට ආසන්න පාරවල් හතරින් එකක ඔවුන්ට අවශ්‍ය ඉඩම් කැබැල්ලක් මිලදීගෙන ඔවුන්ට ලබාදීමට හැකියාව තිබෙනවා. තුන්වෙනි යෝජනාව ඉංජිනේරු වත්තේ ඉඩමේ කොටසක් මෙම රක්ෂණ සංස්ථාවට ලබාදීමයි. මේ විකල්ප තුනෙන් එකකට අපට එන්නට පුළුවන්. නැතිනම් මයුර මන්ත්‍රීතුමා කියූ ආකාරයට රක්ෂණ සංස්ථාව සමඟ එකඟතාවයකට පැමිණ, මෙම ඉඩම අත්පත් කරගෙන එහි බිම්මහලේ ශාලාවක් ඉදි කරලා පුද්ගලයින්ගේ පොදු කටයුතු සඳහා එය ලබාදීමට  සභාවේ එකඟතාවයකට පැමිණිය යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  මානවඩුගේ කැලුම් ජානක මහතා</u>

මේ සම්බන්ධයෙන් මටත් ලිපියක් ආවා. දැන් බෙලිඅත්ත නගරයේ හැම තැනම ගොඩනැගිලි හදලා. මිනිස්සුන්ට පාරේ යාමටවත් නොහැකි මට්ටමකට අද පත්වෙලා තියෙන්නේ. බෙලිඅත්ත ප්‍රදේශයේ ජනතාවට හිස් භූමියක අවශ්‍යතාවය දැඩිව දැනිල තිබෙනවා. ඒ නිසාම එම ඉඩම ප්‍රාදේශීය සභාවට අත්පත් කර ගැනීමට සුදුසු බව මා යෝජනා කරනවා. ඒ වගේ මෙම භූමිය අපට අත්පත් කරගෙන, ඒ වෙනුවට රක්ෂණ සංස්ථාව සඳහා  සභාවේ වාහන නැවතුම් අංගනයේ කොටසක් ලබා දීම සුදුසු යැයි මම යෝජනා කර සිටිනවා.

<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>

මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට අත්පත කර ගැනීමට සුදුසු බවට සියලු දෙනා එකඟ වුණා. මගේ කාලයේ දී මෙම ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීමට නොහැකි වෙයි. නමුත් මෙය කවුරුන් විසින් ඉටුකලත් මෙම භූමිය හිස් භූමියක් ලෙස  තිබිය යුතුයි. මෙම ස්ථානයේ ෂෙඩ් එකක් තැනීමටවත් වෙනත් ගොඩනැගිලි සෑදීමටවත් මම මුල සිටම විරුද්ධයි. මෙම කටයුතු සිදුකිරීමේදී මට යම් යම් බලපෑම් ආවා.මෙම ඉඩමෙන් හැකිලී ඇති බෙලිඅත්ත නගරය දිග හැරීමට හැකියාව තිබෙනවා. රක්ෂණ සංස්ථාව නගරයෙන් එහාට ගියාට ගැටලුවක් නැහැ. ඒ නිසා මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට අත්පත් කර ගැනීමේ කටයුතු ශීඝ්‍රයෙන් ක්‍රියාත්මක කරන ලෙස මා දන්වා සිටිනවා.

ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් ලුණුකඩේ හන්දියේ ඉඩම බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

<u>**05(II).** ගැටමාන්න සමෘද්ධි ප්‍රජාමූල බැංකුව පිහිටි ඉඩම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරීම සඳහා  නිර්දේශ ලබා ගැනීම සම්බන්ධයෙන් එවා ඇති ලිපිය</u>

<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>

ගැටමාන්න සමෘද්ධි ප්‍රජාමූල බැංකුව පිහිටි අ.ග.පි. 296 හි කැබලි අංක 1403  දරන බිම් කැබැල්ල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරීම සඳහා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ලබා ගැනීම සඳහා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලිපියක් අප වෙත යොමු කර තිබෙනවා.

එවා ඇති ලිපි පරිදි,  ගැටමාන්න සමෘද්ධි ප්‍රජාමූල බැංකුව පිහිටි අ.ග.පි. 296 හි කැබලි අංක 1403  දරන බිම් කැබැල්ල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරීම සඳහා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ විරුද්ධතාවයක් නොමැති විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

<u>**05(III).** වාර්ෂික මුද්දර ගාස්තු හා උසාවි දඩ ශේෂයන් නිවැරදි කිරීම සම්බන්ධයෙන් එවා ඇති ලිපිය</u>

<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>

ප්‍රාදේශීය සභාව සඳහා මධ්‍ය රජය මගින් ලබා දිය යුතු මුද්දර ගාස්තු වසර දෙකක කාල සීමාවක් ඉක්මවා ගොස් ඇති බැවින් 1994 අංක 4 දරණ දකුණු පලාත් මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය අනුව ගෙවීම් සිදු කළ නොහැකි බවට ප්‍රධාන ලේකම් විසින් නිර්දේශ ලබා දී තිබෙනවා. බැවින් එම රුපියල් 939,392.00 ක  මුදල අප වෙත නොලැබෙන බැවින් මුද්දර බදු ලේඛනයෙන් ඉවත් කර ගැනීම සුදුසු වේ.එමෙන්ම 2022.12.31 දිනට ප්‍රධාන ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන ලේඛන හා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් නිර්දේශ කර ඇති උප ලේඛන වල පවතින ශේෂය අනුව ගිණුම නිවැරදි කරගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වා ඇත.

මෙම මුදල් ලබාගැනීමට අප විශාල උත්සාහයක් දැරුවත් එය ලබා ගැනීමට අපට හැකියාවක් ලැබුනේ නැහැ. මෙය නැවත නැවත විගණනයට භාජනය වන බැවින් මෙම මුදල අප වෙත නොලැබෙන බැවින් මෙම හිඟය මුද්දර බදු ලේඛනයෙන් ඉවත් කර ගැනීමට සුදුසු බව මා මේ සභාවට දන්වා  සිටිනවා.

ඒ අනුව බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව සඳහා මධ්‍ය රජය මගින් ලැබිය යුතු රුපියල් 939,392.00 ක මුදල වසර දෙකක කාල සීමාවක් ඉක්මවා ගොස් ඇති බැවින් මුද්දර බදු ලේකනයෙන් ඉවත් කරගැනීම සඳහා මහා සභාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**05(IV) ස්ථාවර වත්කම් හා ජංගම වත්කම් ලේඛන - 2022 වර්ෂය**

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**
2022 වර්ෂයේ සඳහා සකස් කරන ලද ජංගම වත්කම් හා ස්ථාවර වත්කම් ලේඛන සකස් කර ඇති අතර එය සභාගත කරන අතර ඕනෑම කෙනෙකුට එය පරිශීලනය කිරීමේ හැකියාව තිබෙනවා.

**06. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**07. යථා පරිදි කල්දී ඇති යෝජනා:-**

**07(I). වීදි පහන් නඩත්තුව සඳහා වීදි පහන් 300 ක් හා විදුලි උපකරණ මිලදී ගැනීමේ යෝජනාව**
යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඩබ්.උදේශිකා හර්ෂනී මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**
බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති මාර්ග ආලෝකන පහන් නඩත්තු කිරීම සඳහා එල්.ඊ.ඩී බල්බ 300 ක් 2023 පලවන කාර්තුව සඳහා ඉල්ලුම් කර ඇති අතර පහත සඳහන් අනෙකුත් විදුලි භාණ්ඩ මෙම වර්ෂය සඳහා ද අවශ්‍ය වන බැවින් එම විදුලි භාණ්ඩ ලබාදීම සඳහා කටයුතු කරන ලෙස බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවයේ විදුලි කාර්මිකවරයා විසින් ලිපියක් මඟින් ඉල්ලීමක් සිදුකර ඇත. ඒ අනුව,

- වීථි පහන් බල්බ 300
- තම්ලා ස්විච 100
- හෝල්ඩර් (සුදු) 2 pin 100
- ටේප් රෝල් 50
- තනි පොට වයර් කොයිල් 02
- ඒරියල් බණ්ඩල් කනෙක්ටර්(යුවල්) 50
- ස්ව ක්‍රියා ස්විච(ඔටෝ සේල්) 50

මෙම භාණ්ඩ මිල දී ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත.ඒ අනුව ඉහත භාණ්ඩ මිල දී ගැනීම මහා සභාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විදාන ආරච්චිගේ උදය කුමාර මහතා**
අලුතෙන් සකස් කරන ලද සහ දැනට අංක නොකරන ලද ලයිට් කණු සඳහාද මෙම විදුලි පහන් සවි කරන ලෙස මා යෝජනා කර සිටිනවා.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**
ඒ අනුව අලුතින් සවි කරන ලද සහ දැනට අංක නොකරන ලද සියලුම ලයිට් කණු සඳහා වෙනමම ලේඛණයක් පවත්වා ගෙන ඒවා සඳහා විදුලි පහන් සවි කරන ලෙස මා යෝජනා කරන අතර එම යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**07(II).බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ බෙලිඅත්ත බස් නැවතුම්පොල පොදු වැසිකිළිය බදු දීම සඳහා ලංසු මුදල තීරණය කිරීමේ යෝජනාව**
යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මානවඩුගේ කැලුම් ජානක මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**
බෙලිඅත්ත බස් නැවතුම්පොල පොදු වැසිකිළිය වර්තමානය වන විට නිසි ආකාරයෙන් පිළිසකර කිරීමේ කටයුතු 99% කින් වැඩ අවසන් කරලා තිබෙනවා. මෙය මුදලක් අය නොකර භාවිතා කිරීමට ලබා දුනහොත් නැවත තිබූ තත්වයටම මෙය පත්වෙනවා. එම නිසා මෙය ලංසු මුදලක් තීරණය කර ටෙන්ඩර් පටිපාටියක් හරහා කිසියම් පුද්ගලයෙකුට මෙය ලබා දිය යුතුය. එසේම අදාල ටෙන්ඩර්කරු විසින් මෙහි මාසික ජල හා විදුලි බිල්පත් ගෙවිය යුතු අතර වැසිකිළිය පවිත්‍ර කිරීමේ කටයුතුද ඔවුන් විසින් සිදුකර ගත යුතුය.

එසේම මෙම වැසිකිලිය විවෘතව නොතබන රාත්‍රී කාලය සඳහා බස් නැවතුම්පොල මධ්‍යයේ ඇති වැසිකිළිය ජනතාවට භාවිතා කිරීම සඳහා විවෘත කරන ලෙස අදාළ පුද්ගලයාට දැනුම් දිය යුතුය. ඊට පෙර තාක්ෂණය නිලධාරිවරයා යොමු කර බස් නැවතුම්පොල මධ්‍යයේ ඇති වැසිකිළිය අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුව ලබා ගෙන ඒ සඳහා කටයුතු කරන ලෙසද මා දන්වා සිටිනවා. එසේම සභාවේ සේවකයින් යොදවා බස්නැවතුම්පොළ ඉහළ මාලයේ ඇති වැසිකිලියත් පවිත්‍ර කරන ලෙස ද මා දන්වා සිටිනවා.

ඒ අනුව දිනකට රුපියල් 100.00 බැගින් දින 30ක් සඳහා රු.3000.00 ක මුදලක් ලංසුව වශයෙන් තීරණය කරන අතර වාර්ෂික ලංසු මුදල රු.36,000.00 ක් වශයෙන් යෝජනා කර සිටිනවා. එසේම, අදාල ටෙන්ඩර්කරු විසින් මෙහි මාසික ජල හා විදුලි බිල්පත් ගෙවිය යුතු අතර වැසිකිළිය පවිත්‍ර කිරීමේ කටයුතු ද ඔවුන් විසින් සිදුකර ගත යුතුය. 2023 වර්ෂය සඳහා 2023.12.31 දින දක්වා කාල සීමාවට අදාල ලංසු මුදල තීරණය කර ටෙන්ඩර් කිරීම සුදුසු වෙනවා.

ඒ අනුව දිනකට රුපියල් 100.00 බැගින් දින 30ක් සඳහා මාසික රු.3000.00 ක මුදලක් ලෙස වාර්ෂික ලංසු මුදල රු.36,000.00 ක් වශයෙන් තීරණය කරන අතර, අදාල ටෙන්ඩර්කරු විසින් මෙහි මාසික ජල හා විදුලි බිල්පත් ගෙවිය යුතු අතර වැසිකිළිය පවිත්‍ර කිරීමේ කටයුතු ද ඔවුන් විසින් සිදුකර ගැනීම සඳහා වූ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

තවද, මෙම පොදු වැසිකිලිය පෙ.ව.5.00 සිට රාත්‍රී 9.00 දක්වා විවෘත කර දැමීමටත්, රාත්‍රී 9.00 සිට පෙ.ව.5.00 දක්වා බස් නැවතුම්පොල ඇතුලත පිහිටි පොදු වැසිකිලිය විවෘතව තැබීමටත් අදාල ටෙන්ඩර්කරු විසින් සිදුකල යුතු බවත්, අදාල පිරිසිදු කිරීම් ඔහු විසින් සිදු කිරීමටත් සභාව සම්මත කරන ලදි.

**07(III). බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ නුගේවෙල රන් සමනලයෝ පෙර පාසල, පලපොත සරණ පෙර පාසල, පට්ටියවෙල ශ්‍රී රතනපාල පෙර පාසල යන පෙර පාසල් අනුමත කර ගැනීමේ ව්‍යාපෘති වාර්තාව පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත අනුමැතියට යැවීමේ යෝජනාව**

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බැදිගම පතිරණගේ ලසන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ නුගේවෙල රන් සමනලයෝ පෙර පාසල, පලපොත සරණ පෙර පාසල, පට්ටියවෙල ශ්‍රී රතනපාල පෙර පාසල යන පාසල් 03 පසුගිය සභා වාරයකදී සභාවට පවරා ගැනීම සඳහා යෝජනා සම්මත විය. ඒ අනුව මෙම පෙර පාසල් වල සිටින පෙර පාසල් පාලිකාවන්ට ලබා දෙන දීමනාව ඔවුන්ට ලබා දිය යුතු වන්නේ මෙම පෙර පාසල් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීමෙන් අනතුරුවයි. ඒ අනුව මෙම පෙර පාසල් තුන අනුමත කර ගැනීමේ ව්‍යාපෘති වාර්තාව පළාත් පාලන දෙපාර්තමේන්තුවතමේන්තුව වෙත යැවීම සඳහා සුදුසු බවට මා යෝජනා කර සිටිනවා.

ඒ අනුව බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ නුගේවෙල රන් සමනලයෝ පෙර පාසල, පලපොත සරණ පෙර පාසල, පට්ටියවෙල ශ්‍රී රතනපාල පෙර පාසල යන පෙරපාසල් අනුමත කර ගැනීමේ ව්‍යාපෘති වාර්තාව පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත අනුමැතියට යැවීමේ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**07(IV). ගොඩවෙල ගොඩැල්ල උඩ කොටසේ රෝහිණී මියගේ නිවස අසල සිට කටුඉඹුල්හේන නිවස දක්වා මාර්ගය ප්‍රාදේශීය සභාවට පවරා ගෙන සංවර්ධනය කරන ලෙස වූ යෝජනාව**

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී.තිලක් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>**
මෙම ඉඩම සම්බන්ධයෙන් යම් යම් ගැටලුකාරී තත්ත්වයන් කිහිපයක්ම තිබෙනවා. මෙහි ඇති ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව සොයා බලා කිසිදු ගැටලුවක් නොමැතිනම් එය ක්‍රියාත්මක කිරීමට සුදුසුයි. එම නිසා අප ආයතනයේ තාක්ෂණ නිලධාරි මහතා යොමුකර මේ මාර්ගයේ නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව ලැබෙන නිගමනයන් ඔස්සේ කටයුතු කිරීමට සුදුසු බව මා යෝජනා කර සිටිනවා.

එම අනුව තාක්ෂණ නිලධාරි මහතාගේ නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව ලැබෙන නිගමනයන් ඔස්සේ කටයුතු කිරීමට සුදුසුට විරෝධතාවයකින් තොරව ඒකතිකව සභා සම්මත විය.

**<u>07(V). කාර්යාල පුස්තකාල ගොඩනැගිල්ලේ අංක 09 දරණ කඩකාමරයේ බදු අයිතිකරුවන වන වන්නිආරච්චි සිරිසේන මහතා මිය ගොස් ඇති බැවින් එම කඩ කාමරය එම මහතාගේ භාර්යාව වන කේ. ජී. මල්කාන්ති මහත්මියට බදු අයිතිය පවරාදීම සම්බන්ධයෙන් වූ යෝජනාව</u>**
යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පි.තිලක් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>**
කාර්යාල පුස්තකාල ගොඩනැගිල්ලේ අංක 09 දරණ කඩ කාමරයේ බදුකරු වන වන්නිආරච්චි කංකානම්ගේ සිරිසේන මහතා මිය ගොස් ඇති බැවින් ඔහුගේ භාර්යාව වන කේ.ජී. මාලාකාන්ති යන අය විසින් සභාවට ලිපියක් යොමු කරමින් ප්‍රකාශ කර ඇත්තේ එම කඩ කාමරයේ බදු අයිතිකරු වන වන්නිආරච්චි කංකානම්ගේ සිරිසේන මහතා මිය ගොස් ඇති බැවින් එම කඩ කාමරයේ බදු අයිතිය ඔහුගේ බිරිඳ වන කේ.ජී. මාලාකාන්ති වන මා හට පවරා දෙන ලෙසයි. ඒ අනුව මෙම කඩ කාමරයේ අයිතිය සිරිසේන මහතාගේ භාර්යාව වන කේ.ජී. මාලාකාන්ති මහත්මියට පැවරිය යුතුයි. එසේ නොමැතිනම් මෙය ටෙන්ඩර් කර ලබා දිය යුතුයි. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අදහස් දක්වන්න.
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා</u>**
මගේ තීරණය නම් එකිනෙකට වෙනස් වන්නේ නැහැ. මගේ තීරණය වන්නේ ටෙන්ඩර් පටිපාටියකින් තොරව කඩ බදු දිය නොහැකි බවයි. මෙම කඩ කාමර ටෙන්ඩර් නොකල ලබාදීම තුළින් වෙනත් කිසිදු පුද්ගලයෙකුට මෙම කඩ කාමර වල බදු අයිතිය ලබාගත නොහැකියි. මේ කඩ කාමර වල බදු අයිතිය සදාකාලිකව පවතින්නේ පවුලේ අය මතයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා</u>**
ව්‍යවස්ථාවට අනුව කඩ කාමර හිමියාගේ ඉල්ලීම මත හෝ ඔහුගේ මිය යාමෙන් පසු ඔහුගේ බිරිඳට හෝ වයස අවුරුදු 18 ට වැඩි නම් එම දරුවාට මෙම කඩ කාමරයේ අයිතිය අදාල පළාත් පාලන ආයතනය විසින් පවරා දිය යුතු යැයි 01/2010 චක්‍රලේඛයේ සඳහන් කර තිබෙනවා. ඒ අනුව මෙම කඩ කාමරයේ අයිතිය හිමි විය යුත්තේ මෙම පුද්ගලයාගේ බිරිඳටයි.

**<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>**
මෙම කඩ කාමරය ලබා දෙන්නේ වන්නිආරච්චි කංකානම්ගේ සිරිසේන යන පුද්ගලයාගේ බිරිඳවන කේ.ජී. මල්කාන්ති මහත්මියටයි.

ඒ අනුව කාර්යාල පුස්තකාල ගොඩනැගිල්ලේ අංක 09 දරණ කඩකාමරයේ බදු අයිතිකරුවන වන වන්නිආරච්චි සිරිසේන මහතා මිය ගොස් ඇති බැවින් එම කඩ කාමරය එම මහතාගේ භාර්යාව වන කේ. ජී. මල්කාන්ති මහත්මියට බදු අයිතිය පවරාදීම සම්බන්ධයෙන් වූ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතාගේ එකගතාවයෙන් තොරව අනෙකුත් සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවයෙන් සභා සම්මත විය.

**<u>07(VI). බෙලිඅත්ත ආයුර්වේද රෝහලේ කාර්ය මණ්ඩලය පුරප්පාඩු වීම මත ජනතාවට සේවය ලබා ගැනීමට නොහැකි වීම තුළ, එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අවධානයට යොමු කිරීම සඳහා ලිපියක් යැවීම සම්බන්ධයෙන් වූ යෝජනාව</u>**

යෝජනාකරු -: ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දයාරත්න ගුණවර්ධන මහතා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දයාරත්න ගුණවර්ධන මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බැදිගම පතිරණගේ ලසන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දයාරත්න ගුණවර්ධන මහතා**

බෙලිඅත්ත ආයුර්වේද රෝහල් ප්‍රදේශයේ තිබෙන වැදගත්, අත්‍යවශ්‍ය රෝහලක්ය. මේ ප්‍රදේශයේ ජනතාවට වඩා මෙහි වටිනාකම දැනී ඇත්තේ මේ ප්‍රදේශයෙන් භාහිර පුද්ගලයන්ටයි. ආයුර්වේද රෝහලට වසර 50ක් සම්පූර්ණ වීමත් සමග මෙයට ඉතාමත් අභාග්‍ය සම්පන්න තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. මෙහි ප්‍රධාන වෛද්‍ය අධිකාරීතුමිය රෝහල් කමිටුවේ දී ප්‍රකාශ කර සිටියේ මෙහි වැඩ කටයුතු කරගෙන යාමට කාර්ය මණ්ඩලය 54 දෙනෙකු අවශ්‍ය වුවත් එහි දැනට සේවය කරන්නේ සේවකයින් 18 දෙනෙකු බවයි. එසේම තවත් සේවකයින් තුන්දෙනෙකු විශ්‍රාම යාමටත් සිටින බවද එතුමිය වැඩිදුරටත් ප්‍රකාශකර සිටියා. මේ නිසා මෙම රෝහලට පැමිණෙන රෝගීන්ට නිසි ආකාරයට ඔවුන්ගේ සේවය ලබාදීමට නොහැකි මට්ටමකට එය අද පත්වෙලා තිබෙනවා. එසේම පසුගිය දිනවල දී රෝහල් කමිටුවේ නිර්දේශය මත මෙම ඌණතාවය සහිත සේවකයින් බඳවා ගැනීම සඳහා ඉල්ලීම් කර ආණ්ඩුකාරතුමාට ලිපියක යොමු කලා.

මෙම රෝහලේ දැනට සායන 26 කට ආසන්න ප්‍රමාණයක් පවත්වනවා. එසේම ඒවා නිසි ආකාරයට ඉටු කර ගැනීමට වර්තමානය වන විට නොහැකි වෙලා තිබෙනවා. ගාල්ල ආයුර්වේද රෝහලේ දැනට සේවකයින් අතිරික්තව සිටින බවට අපට දැනගැනීමට ලැබුණා. එසේම රජය මඟින් දැනට සේවකයින් බඳවා ගැනීමක් සිදු නොකරන නිසා මේ අතිරික්ත සේවකයින්ගෙන් සේවකයින් කිහිප දෙනෙකු හෝ මෙම බෙලිඅත්ත ආයුර්වේද රෝහලට ලබා දෙන ලෙස එතුමිය විසින් ඉල්ලීම් කලා.

එසේම ආයුර්වේද රෝහලට බෙහෙත් ඖෂධ වර්ග ලබා දීමේදී යම් ගැටලුවක් ඇති වී තිබෙන නිසා බෙහෙත් පැළෑටිවල යම් හිඟතාවයක් ඇතිවී තිබෙනවා. එම නිසා රෝහල් කමිටුවේ දී තීරණය කළේ පාසල් වෙත මෙම බෙහෙත් ද්‍රව්‍ය ලබා දී ඔවුන්ගෙන් මෙම බෙහෙත් පැළෑටි නැවත එකතු කර ගැනීමටයි. වෛද්‍ය අධිකාරිතුමිය ප්‍රකාශ කර සිටියේ මෙම සේවකයින් බඳවා ගැනීම හා ඖෂධ වර්ග ලබාගැනීම ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවක් ලෙස සහයෝගය ලබා දෙන ලෙසටයි. ඒ වගේම මෙහි ඇති ඖෂධ උයන වල්බිහි වී ඇති බැවින් එය පිරිසිදු කිරීමේ කටයුතු සඳහා සේවකයින් කිහිප දෙනකු යොදවන ලෙස මා සභාපතිවරයාගෙන් ඉල්ලා සිටියා. ඒ අනුව ඔවුන් එම කාර්යය දින තුනක් සිදුකලත් ඖෂධය උයන සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරීමට නොහැකි වෙලා තිබෙනවා. එම නිසා අප සියලු දෙනාගේ සහයෝගය ලබාගෙන මෙම ඖෂධ උයනත් නැවත පිරිසිදු කරමු.

ඒ වගේම ගාල්ල ආයුර්වේද රෝහලේ දැනට සේවකයින් අතිරික්තව සිටින බැවින් මේ අතිරික්ත සේවකයින්ගෙන් සේවකයින් කිහිප දෙනෙකු හෝ මෙම බෙලිඅත්ත ආයුර්වේද රෝහලට ලබා දෙන ලෙස සභාවක් ලෙස අපිත් ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිපියක් යොමු කර ඉල්ලා සිටිමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී.ප්‍රභාත් චන්ද්‍ර කුමාර මහතා**

වර්තමානයේ මෙම රෝහල පත් වී ඇති තත්වය සමඟ බෙලිඅත්ත රෝහලට එන බොහොමයක් රෝගීන් කැකණදුර රෝහලට යාමට යොමුවෙලා තිබෙනවා. පසුගිය කාලයේ දී බහුකාර්ය යෝජනාව යටතේ බඳවා ගත් සේවකයින් නිසි භාරදූර රාජකාරියක් පැවරී නැහැ. මෙම තරුණයින්ගෙන් රටට විශාල සේවයක් ලබා ගන්න පුළුවන්. මුල් කාලයේදී මෙම ආයුර්වේද රෝහලටත් බහුකාර්ය නිලධාරීන් කිහිප දෙනකුම යොදවලා තිබුණා. ඔවුන් එහි පුහුණුව ලබා ගැනීමෙන් පසු වුවත්, ඔවුන් එතැනින් ඉවත් කිරීම සිදු කරලා තිබෙනවා. මෙම රෝහලට සේවකයින්ගේ අවශ්‍යතාවය ඉතාමත් දැඩිව බලපාලා තිබෙනවා. එසේම පාසල් ළමුන් දහයක් දොළහක් පමණ සිටින පාසල් වලට මෙම බහුකාර්ය නිලධාරීන් තුන් දෙනෙකු බැගින් අනියුක්ත කරලා තිබෙනවා.

එම නිසා අලුතින් රැකියා දීමට අවශ්‍යතාවයක් නැහැ. මෙම නිලධාරීන් මේ සඳහා යොදවන පුළුවන්. එම නිසා ප්‍රාදේශීය ලේකම්තුමිය සමග සාකච්ඡා කර මෙම බහුකාර්ය මා යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඩබ්.උදේශිකා හර්ෂනී මහත්මිය**

මමත් මේ ආයුර්වේද රෝහලෙන් සේවාව ලබාගෙන තිබෙනවා. ඔවුන් එහිදී ඉතාමත් විශිෂ්ඨ සේවයක් සපයනවා. මටත් මෙහි ප්‍රධාන වෛද්‍ය අධිකාරියතුමිය ප්‍රකාශ කර සිටියේ සේවාව සැපයීම සඳහා කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවන බවයි. එම ස්ථානයේ විශාල සේවාවක් සපයන නිසා මේ අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා ගැනීම සඳහා හැකි ඉක්මනින් කටයුතු කරමුයි කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා**

මේ යෝජනාව තුළින් අපට පෙනෙන්නේ රට කඩා වැටෙන ප්‍රමාණයයි. ආයුර්වේද රෝහල වෙනමම දෙපාර්තමේන්තුවක් මඟින් පාලනය වෙමින්, නඩත්තු වෙමින් පවතින ආයතනයක්. නමුත් වර්තමානය වන විට මෙසේ වෙනම දෙපාර්තමේන්තුවක් මගින් පාලනය වන ආයතනයක සේවක පුරප්පාඩු පියවා ගැනීමට කතා කිරීමට සිදුවී ඇත්තේ රෝහල් කමිටුව නියෝජනය කරන මන්ත්‍රීවරයාටයි. මෙම කාරණාවට

වගකිවයුත්තේ ආයුර්වේද දෙපාර්තමේන්තුවයි. අපට මෙම ආයුර්වේද රෝහලට සේවකයින් ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීමට පුළුවන්. නමුත් එය ලියවිල්ලකට පමණක් සීමා වෙයි. අපට සිදු කළ හැක්කේ මෙම සේවකයින් ලබා දෙන ලෙසට යම් බලපෑමක් පමණයි.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ වලට අනුව වර්තමානය වන විට කිසිම ආයතනයකට කිසිම සේවයෙක් බඳවා ගැනීමට නොහැකි තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. සෞඛ්‍ය කියන්නේ අත්‍යවශ්‍ය සේවයක්. එම නිසා අපේ නගරයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනා එකතු වී ශ්‍රමදානයක් සංවිධානය කරන්න. ඒ තුලින් ඖෂධ උයන පිරිසිදු කිරීමේ කටයුතු අපි සිදු කරමු. ඒ සඳහා ප්‍රාදේශීය සභාවේ සේවකයින් කීපදෙනකු හා නිලධාරීන් පිරිසක් යොමු කරමු. නමුත් වෛද්‍ය අධිකාරී තුමිය විසින් සිටින සේවකයින්ගෙන් වැඩ ගැනීම සිදුකල යුතුයි. අපි ආයුර්වේද රෝහලේ ප්‍රධාන වෛද්‍ය අධිකාරී තුමිය, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හා ප්‍රාදේශීය ලේකම්තුමිය කැඳවා සාකච්ඡාවක් පවත්වා මෙම බහු කාර්ය නිලධාරීන් මෙම ආයතනයට අනුයුක්ත කර ගැනීම සඳහා කටයුතු කිරීමට අදාළ සාකච්ඡාවක් පවත්වමු.

ඒ අනුව,ඉහත කරුණු අනුව කටයුතු කිරීම සඳහා මහා සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**07(VII). පුවක්දණ්ඩාව දෙවන විශ්කම්පුර පලවන හරස් මාර්ගය "දේශබන්දු චන්ද්‍රා බාලාචාරී මාවත" ලෙස නම් කිරීම පිළිබඳ වූ යෝජනාව**

යෝජනාකරු -: ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චමිල ප්‍රේමනාත් මහතා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චමිල ප්‍රේමනාත් මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.ශාන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චමිල ප්‍රේමනාත් මහතා**

මෙම යෝජනාව මීට ඉහත දී කිරීමට තිබූ යෝජනාවක්. මෙතුමාගේ පළමු ගුණසමරු අවස්ථාවේදී මේ පාර මෙතුමාගේ නමින් නම්කර පුවරුවක් සවි කරත් එය නීත්‍යානුකූල නොවන නිසායි මා මේ යෝජනාව ගෙන ආවේ. මෙතුමා ඉතාමත් දැවැන්ත වැඩ කොටසක් මැදගොඩ, විශ්කම්පුර ප්‍රදේශයට ඉටුකරලා තිබෙනවා. විස්කම්පුර තිබෙන මාර්ග අටෙන් මාර්ග හයක් මෙතුමා විසින් සංවර්ධනය කලා. මේ පාර මෙතුමා විසින් JCB යන්ත්‍ර ගෙනල්ල බලෙන් පාර කපලා මැදගොඩ ගම්මානය සමග ඒකාබද්ධ කළා. අදටත් මේ විශ්කම්පුර එක මාර්ගයක්වත් කැඩිලා නැහැ. එම නිසා එතුමා කළ සේවය අගයලා එතුමාගේ නමින් මේ පාර නම් කරන ලෙස මා යොජනා කර සිටිනවා.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

පළමු වරට ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයා ලෙස කටයුතු කළේ චමිල් මන්ත්‍රීතුමාගේ පියා. එතුමා ඉතාමත් මානුෂිය ගතිගුණ තිබෙන හොඳ මනුස්සයෙක්. එමනිසා මෙය කාලෝචිත යෝජනාවක්.මෙය ක්‍රියාත්මක කරන දිනයේ දී අපටත් ආරාධනා කරන්න. අපිත් ඒ සඳහා එතුමාට උපහාරයක් ලෙස එතනට සහභාගි වෙන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මානවඩුගේ කැලුම් ජානක මහතා**

දේශබන්දු චන්ද්‍රා බාලාචාරී මහතා මගේ දේශපාලන ඉතිහාසයේ හමු වූ ඉතාමත් සොඳුරු නිහතමානී මනුස්සයෙක්. එතුමා කිසිම පුද්ගලයකුගෙන් බැනුමක් වචනයක් නොඅසන පුද්ගලයෙක්. එතුමාගේ නම මේ පාරට නම් කිරීම ගැන මම ඉතාමත් සතුටු වෙනවා. ඒ වගේම මේ පාර මේ නමින් දිගු කාලයක් රැඳේවා යි කියා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා**

පාරකට නමක් යෙදීමේදී ඒ සඳහා වෙන්වූ වෙනම ක්‍රමවේදයක් තිබෙනවා. කිසියම් පාරකට කිසියම් පුද්ගලයෙකුගේ නමක් යෝජනා කළ විට ඒ පාර සිටින පුද්ගලයින් ඒ පාරට එම නම යෙදීමට විරුද්ධ වුවහොත් ඒ අදාළ පුද්ගලයාට කරන අගෞරවයක් වෙනවා. ඒ වගේම දේශපාලන ඉතිහාසයේ විශිෂ්ඨ සේවයක් කළ මෙම පුද්ගලයාගේ නම ඒ ගමට ඒ මාවතට යෝජනා කිරීමට සිදුවූයේ එතුමාගේ පුතාටයි. ඒ ගැන අප සියලු දෙනා කණගාටු විය යුතුයි. මේ සම්බන්ධයෙන් අපේ විරුද්ධතාවයක් නැහැ. මේ පාර නම් කිරීමට එම පාරේ සිටින ජනතාව කැමැති විය යුතුයි. එහෙම නොවුනහොත් කවුරුහරි පුද්ගලයෙක් මේ පාරේ බෝඩ් එක ගලවලා දැම්මොත් එය මේ පාර නම් කරපු පුද්ගලයාට කරන අගෞරවයක්. ඒ නිසා මේ කරුණු සැලකිල්ලට ගෙන, මේ කරුණු පිළිබඳව සිතා බලා අදාල කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

පස්වරු 01.05 ට පමණ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඩබ්.උදේශිකා හර්ෂනී මහත්මියසභා රුස්වීමෙන් පිටව යන ලදි.

## 07.(VIII) බෙලිඅත්ත නගර සැලැස්ම අඩුපාඩු සකසා අනුමත කර ගැනීම පිළිබඳව වූ යෝජනාව

යෝජනාකරු -: ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මානවඩුගේ කැලුම් ජානක මහතා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මානවඩුගේ කැලුම් ජානක මහතාවිසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.අමල් ඉන්දික මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මානවඩුගේ කැලුම් ජානක මහතා**

බෙලිඅත්ත නගරයේ සැලසුමක් නොමැති බව නිසාත්, විටින් විට පැමිණි ප්‍රාදේශීය සභාවේ පාලකයින් විසින් ඉදිකර ඇති ගොඩනැගිලි, වැසිකිලි පද්ධති, මාර්ග පද්ධති, බොකු සහ වැසි ජලය බැස යන ප්‍රධාන කාණු පද්ධති, පොළ භූමිය, පොළ භූමියේ ඉදිකර ඇති ගොඩනැගිලි හා කාණු පද්ධති, මාළු වෙළඳසැල හා එහි ගොඩනැගිලි සහ ජලය බැස යන කාණු පද්ධති විටින් විට සැලසුමක් නොමැතිව සංවර්ධනය කළ පොළ භූමිය නිසා වෙළඳ සහ පාරිභෝගික ජනතාවට අවම මූලික මිනිස් අයිතිවාසිකම් ගිලිහී ඇතිබව කිව යුතුය. මුදල් ප්‍රතිපාදන ලැබුණු අවස්ථා වල පවා යම් යම් හේතු කියාපාමින් ඉදිරිපත් වන මන්ත්‍රීවරුන්ගේ විරෝධය නිසා බෙලිඅත්ත නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීම වසර ගණනාවක් තිස්සේ අතපසු කරමින් පවතී. තවත් විටෙක සභාවේ බලය යම් සභාපතිවරයෙකුගේ ඕනෑ එපාකම් මත බලහත්කාරයෙන් ඔවුන්ට රිසි පරිදි බෙලිඅත්ත නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීමට යාමේදී විපක්ෂ මන්ත්‍රීවරුන් සහ නගරයේ ජනතාව සහ වෙළෙඳ ප්‍රජාව විරෝධය පෑම නිසා නගර සැලැස්ම ක්‍රියාත්මක නොවිණි.

ඒ අනුව මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැලුම් මානවඩු මහතා විසින් සභාවට ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව බෙලිඅත්ත ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් ලබාදීම බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ වගකීමක් බවත් මතක් කරමින් මෙම බෙලිඅත්ත නගර සැලැස්ම ඉක්මණින් සකසා අවසන් කරන ලෙසට ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

කැලුම් මන්ත්‍රීතුමා නගර සැලැස්මේ අඩුපාඩු සකසා අනුමත කර ගැනීම පිළිබඳ මේ සභාවට යෝජනාවක් ගෙනාවා. මෙම බෙලිඅත්ත නගරයේ සකස් කිරීම සඳහා පැවති දේශපාලන පක්ෂ සෑම එකකින්ම විවිධ ක්‍රමවේදයන් අනුගමනය කළා. මේ නගරය තුළ අනවසර, අනවශ්‍ය ඉදිකිරීම් කිහිපයක්ම තිබෙනවා. නමුත් මගේ ධූර කාලය තුළ නම් එවැනි අනවශ්‍ය ඉදිකිරීම් කිරීමට මම ඉඩ ලබා දුන්නේ නැහැ. නගරයක් සැළසුම් කළ යුත්තේ අදටත්, හෙටටත්, අනාගතයට ගැලපෙන උචිත ආකාරයටයි. මේ නිසා තමයි ලුණු කඩේ හංදිය ඉඩම අත්පත්කර ගැනීමට අපි කටයුතු කරන්නේ. මට මේ නගරයේ සකස් කිරීමට නොහැකි වුවත් ඉදිරියට පත්වන දේශපාලන පක්ෂයකට මෙය හරියාකාර සකස් කිරීමට අවශ්‍ය සහයෝගය මම උපරිමයෙන්ම ලබා දෙනවා. බෙලිඅත්ත නගරයට නායකයින් වැඩි වූ නිසයි මේ නගරය හරි ආකාරය සකස් කරන්න නොහැකි වෙලා තියෙන්නේ. අපි මේ නගරයේ හදන්න ඕන master plan එක හදලා තියෙන්නේ. අපි මේ පැලැන් එක නැවත නාගරික සංවර්ධන අධිකාරියත් සමඟ සාකච්ඡා කරලා මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සොයාගෙන මෙය ක්‍රියාත්මක කරමු. නාගරික සංවර්ධන අධිකාරියේ අනවශ්‍ය සල්ලි තිබෙනවා.

පසුගිය දිනවලදී නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙට ආවා. නමුත් ඔහු ප්‍රායෝගිකව කටයුතු කරන පුද්ගලයෙකු නොවෙයි. ඔහු අම්පිටිය වැවේ ඇවිදින මංතීරුව නිරීක්ෂණය කරලා අපට එය භාර ගන්නා ලෙස පැවසුවා. නමුත් එය නිසි පරිදි සකසා නොතිබීම නිසාත්, එහි අඩුපාඩු තිබීම නිසාත් මම එය භාර ගැනීම ප්‍රතික්ෂේප කර සිටියා. එයට පිවිසෙන ස්ථානයේ ඇති අධිවේගී මාර්ගයේ පුවරුව එතනින් ඉවත් කර තිබුණේ නැහැ. එසේම මං තීරුවට පිවිසීමට හා වාහනයක් නතර කිරීම සඳහා මෙම ස්ථානයට ආසන්නයේ ඇති ඉඩම අපේ මුදලින් හෝ අත්පත් කරගෙන එහි ඉදිකිරීම් ඔවුන්ට ඉටුකරන ලෙස පැවැසුවත් ඔවුන් ඒවා ක්‍රියාත්මක කළේ නැහැ. ඒ වගේම අපි පවසා සිටියේ මෙය උප කොන්ත්‍රාත්කරුවකුට ලබාදී ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලෙසයි. එයත් ඔවුන් විසින් ප්‍රතික්ෂේප කලා. මෙම ව්‍යාපෘතිය සිදුවුණේ කෝටි ගණනක මුදල් අපතේ යාමක් සහ වැවේ කොටසක් ගොඩ වීම පමණයි.

මගේ ධූර කාලයේ ලබන සති දෙක ඇතුළත අවසන් නොවුණහොත් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් කැඳවලා මන්ත්‍රීවරුන් හා අදාල විෂයභාර නිලධාරීන් සම්බන්ධ කරගෙන අප මේ පිළිබඳව සාකච්ඡා කර මේ මාස්ටර් ප්ලෑන් එකේ ඇති අඩුපාඩු සැකසීමට කටයුතු කරමු. එතෙක් මෙම ව්‍යාපෘතිය භාර ගැනීම ප්‍රතික්ෂේප කර ගැනීම ප්‍රතික්ෂේප කර සිටීමට කටයුතු කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා**

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව තුළ වැඩි වශයෙන් කතාබහට ලක් වූ මාතෘකාව වන්නේ නගර සංවර්ධන සැලැස්මයි. නමුත් තවමත් විධිමත් නගර සැලැස්මක් සකසා කරලා ඒ අනුව ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ වගේම නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එකතු වී සකස් කර ඇති නගර සංවර්ධන සැලැස්ම මේ නගරයට උචිතද යන්න පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා. ඒ නිසා නාගරික සංවර්ධන අධිකාරිය අදාල නිලධාරීන් සමඟ සාකච්ඡා කරන මේ සඳහා නිවැරදි තීරණයකට පැමිණිය යුතුයි.

**08.කාරක සභා වල වාර්තා - -**

**09.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතුකළ අදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම සලකා බැලීම.**

**09 (i).2023 ජනවාරි මස ප්‍රා.ස.16 ලැබීම් සාරාංශය සහ ප්‍රා.ස.14 ගෙවීම් සාරාංශය ඉදිරිපත් කිරීම.**

| වැය විෂයන් | එකතුව රු. ශත | අය විෂයන් | එකතුව රු. ශත |
|---|---|---|---|
| 01.වැටුප් හා දීමනා | 5,458,446.66 | 10.වරිපනම් බදු | 1,177,440.70 |
| 02.ගමන් වියදම් | 880.00 | 20.කුලී | 846,332.50 |
| 03.සැ.හා උපකරණ | 245,005.00 | 30.බලපත්‍ර ගාස්තු | 152,030.00 |
| 04.ප්‍රා.ව.අළු හා නඩත්තු | 59,870.00 | 40.සේවා සඳහා ගාස්තු | 500,885.05 |
| 05.ප්‍රා.සම්.හා ආව.සේවා | 55,847.70 | 50.වරෙන්තු ගාස්තු හා දඩ | 40,417.00 |
| 06.පොලී ලා.ප්‍ර.මුදල් | 0.00 | 60.වෙනත් ආදායම් | 287,436.81 |
| 07.ආ.මු.දා.මු.සහනාධාර | 12,160.00 | 70. වෙනත් ආධාර | 5,649,915.92 |
| 08.වි.වැ.ප්‍ර.පාරිතෝෂික | 0.00 | 80.මූලධන ලැබීම | 0.00 |
| 09.ප්‍රාග්ධන වැය | 0.00 | ස්ථාවර තැ.ආපසු | 0.00 |
| 10.ණය ආපසු ගෙවීම | 0.00 | සේවක ණය | 285,877.25 |
| සේවක ණය | 0.00 | තැන්පත් | 1,361,342.67 |
| තැන්පත් | 6,690.00 | අත්තිකාරම් | 0.00 |
| ණය හිමියෝ | 26,147,782.14 | ණයගැති | 22,923,912.78 |
| අත්තිකාරම් | 22,721.73 | වැය ශීර්ෂයට ආපසු | 56,263.73 |
| අය ශීර්ෂ ආපසු | 2,500.00 | ගිණුම් මාරු | 0.00 |
| ස්ථාවර තැන්පත් | 0.00 | අඟරු චෙක් | 0.00 |
| පෙර ගෙවීම් | 0.00 | ආදායම් හා වෙනත් ලැබීම් | 0.00 |
| ගිණුම් මාරු | 0.00 | | |
| **මුළු එකතුව** | **32,011,903.23** | **මුළු එකතුව** | **33,281,854.41** |

ඉහත අංක 09. (1) හි 2023 ජනවාරි මස ප්‍රා.ස. 14 හා ප්‍රා.ස. 16 වාර්තා පිළිගැනීමට සුදුසු බව ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පි.තිලක් කුමාර මහතා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත කරන ලදී.

**09.(II) සභා ආවරණ අනුමැතිය යටතේ කළ ගෙවීම් ඇතුලු 2023 ජනවාරි මාසයේ කරන ලද සියළුම ගෙවීම් අනුමත කිරීම.**

| | | පොදු ගිණුම | |
|---|---|---|---|
| අ.අ | වවුචර් අංකය | කාරණය | මුදල රු. |
| 1 | 1 | 2022 දෙසැම්බර් මස අනියම් සේවක වැටුප් ගෙවීම | 1,207,788.33 |
| 2 | 2 | ප්‍රායෝගික පුහුණුව ලබන අභ්‍යාසලාභී 2022 නො, දෙසැ. දීමනාව ගෙවීම - ඩබ්.ඒ.එච්.ජී. ප්‍රියශානි | 19,500.00 |
| 3 | 3 | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - එන්.ජී.ඩී. ප්‍රියකාන්ති | 6,200.00 |
| 4 | 4 | ප්‍රායෝගික පුහුණුව ලබන අභ්‍යාසලාභී 2022 නො, දෙසැ. දීමනාව ගෙවීම - එඒ.ඒ. නිමාෂා හංසනී | 19,500.00 |
| 5 | 5 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - ඩී.ඩබ්. නීල් කුමාර | 3,851.00 |
| 6 | 6 | 2022 නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - ඩබ්.ඒ. ජයතිලක | 3,851.00 |
| 7 | 7 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - ඩබ්.ඒ. ජයතිලක | 3,851.00 |
| 8 | 8 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - කේ.ජී. ගුණසිරි | 3,851.00 |
| 9 | 9 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - නිහාල් රංජිත් | 3,851.00 |
| 10 | 10 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම- එච්.එම්. සුපුන් තරංග | 1,666.00 |
| 11 | 11 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම- ඩබ්. තරිදු මදුශංක | 1,666.00 |
| 12 | 12 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - කේ.ඒ. දනුෂ් මහේෂ් | 3,592.00 |
| 13 | 13 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - ඉන්දික ඒ. කොඩිතුවක්කු | 3,925.00 |

| | | | |
|---|---|---|---|
| 14 | 14 | ගමන් වියදම් ගෙවීම - එච්.එම්. ගමගේ | 2,610.00 |
| 15 | 15 | ප්‍රායෝගික පුහුණුව ලබන අභ්‍යාසලාභී 2022 නො, දෙසැ. දීමනාව ගෙවීම - එච්.ඒ. නිමාෂා හංසනී | 19,500.00 |
| 16 | 16 | ටිපර් රථය අලුත්වැඩියාවේ තාක්ෂණ වාර්තාව ලබාදීම - ජේ.ඒ.කේ. වික්‍රමසිංහ | 500.00 |
| 17 | 17 | ටිපර් රථය අලුත්වැඩියාවේ පෙර වාර්තාව ලබාදීම - ජේ.ඒ.කේ. වික්‍රමසිංහ | 500.00 |
| 18 | 18 | ටිපර් රථය අලුත්වැඩියාවේ පසු වාර්තාව ලබාදීම - ජේ.ඒ.කේ. වික්‍රමසිංහ | 500.00 |
| 19 | 19 | 2023 ජනවාරි මස සභික දීමනා ගෙවීම | 420,000.00 |
| 20 | 20 | 2023 ජනවාරි මස සභික දුරකථන දීමනා ගෙවීම | 28,500.00 |
| 21 | 21 | තණකොල කපන යන්ත්‍ර වලට ඔයිල් සැපයීම - අලුත් ආර්වි ඔයිල් | 11,000.00 |
| 22 | 22 | PF-7460 කැබ් රථයට ඉන්ධන සැපයුම් ගාස්තු ගෙවීම | 51,600.00 |
| 23 | 23 | 270-2143 ට්‍රැක්ටර් රථයට ඉන්ධන සැපයුම් ගාස්තු ගෙවීම | 16,900.00 |
| 24 | 24 | LL-7643 කැබ් රථයට ඉන්ධන සැපයුම් ගාස්තු ගෙවීම | 76,150.00 |
| 25 | 25 | 75-3726 අත් ට්‍රැක්ටරයට ඉන්ධන සැපයුම් ගාස්තු ගෙවීම | 6,055.00 |
| 26 | 26 | තණකොල කපන යන්ත්‍ර වලට ඉන්ධන සැපයීම | 24,300.00 |
| 27 | 27 | ABV-0691 ත්‍රිරෝද රථයට ඉන්ධන සැපයුම් ගාස්තු ගෙවීම | 10,550.00 |
| 28 | 28 | HW-6385 ත්‍රිරෝද රථයට ඉන්ධන සැපයුම් ගාස්තු ගෙවීම | 10,790.00 |
| 29 | 29 | RD-7620 ටිපර් රථයට ඉන්ධන සැපයුම් ගාස්තු ගෙවීම | 29,700.00 |
| 30 | 30 | කාර්යාල ගොඩනැගිල්ල පිරිසිදු කිරීමේ ගාස්තු ගෙවීම - සැන්ටොප් ග්ලීම් සර්විස් | 60,000.00 |
| 31 | 31 | කෘ කැබ් රථයේ ඉන්ධන ටැංකියට ඉබි යතුරු ලබාගැනීම - සිටිනාමලුව හාඩ්වෙයාර් | 500.00 |
| 32 | 32 | 2023.01.05 ආදාහනාගාරය සඳහා ගෑස් සිලින්ඩර් 05 ක් ලබාගැනීම - සිටිනාමලුව හාඩ්වෙයාර් | 93,250.00 |
| 33 | 33 | කොම්පෝස්ට් ව්‍යාපෘතියට ඉදල් හා රේක්ක ලබාගැනීම - සිටිනාමලුව හාඩ්වෙයාර් | 1,060.00 |
| 34 | 34 | ශ්‍රී දම්මානන්ද පෙර පාසල සඳහා ඉබි යතුරු 04 ක් ලබාගැනීම - ඕෂදී ග්ලාස් සෙන්ටර් | 3,700.00 |
| 35 | 35 | කොල අතු කපන ට්‍රැක්ටරය අලුත්වැඩියාවට ද්‍රව්‍ය ලබාගැනීම  - ඕෂදී ග්ලාස් සෙන්ටර් | 3,275.00 |
| 36 | 36 | 2023.01.05 විගණන කමිටුවේ සංග්‍රහ ද්‍රව්‍ය ලබාගැනීම - පී.එස්. සමරවීර | 9,325.00 |
| 37 | 37 | සභාපති නිල කාමරයේ වැසිකිලිය අලුත්වැඩියා කිරීම - මිලාජ් ෆර්නිචර් | 4,650.00 |
| 38 | 38 | කාර්යාල පරිබෝජනය සඳහා ජල බෝතල් ලබාගැනීම - රොහාන් තුඩුවෙවත්ත | 3,100.00 |
| 39 | 39 | 2023.01.03 කාර්යාලය සඳහා සංග්‍රහ ද්‍රව්‍ය ලබාගැනීම - චන්දිමාල් ෆෘට් සිටි | 4,640.00 |
| 40 | 40 | ජලනල එලීමට මාර්ග පළුදු තැන්පත් ගාස්තු නැවත ගෙවීම - අයි. එච්. සමිත් කෝකිල | 3,500.00 |
| 41 | 41 | ජලනල එලීමට මාර්ග පලුදු සඳහා තැන්පත් මුදල් නැවත ගෙවීම - ඩබ්. සුමණරත්න | 3,190.00 |
| 42 | 42 | වීථි රේඛා සහතික මුදලක් නැවත ගෙවීම - එල්.එච්. නිහාල් | 2,500.00 |
| 43 | 43 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - යූ.වී.පී. අමිල | 3,851.00 |
| 44 | 44 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - අජන්ත සංජය | 3,851.00 |
| 45 | 45 | 2022 දෙසැම්බර් අතිකාල දීමනා ගෙවීම - එස්.එල්.ඒ. ලලිත් කුමාර | 3,851.00 |
| 46 | 46 | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - කේ.ජී. කොමුදි හසිනිකා | 5,500.00 |
| 47 | 47 | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - ඩබ්.කේ. නන්දිකා | 6,130.00 |
| 48 | 48 | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - එච්.එන්. සාමාලිලී | 6,200.00 |
| 49 | 49 | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - ඩබ්.ඒ.කේ. විමලා | 6,200.00 |
| 50 | 50 | 2023 වර්ෂයට වරිපනම් තක්සේරු දැන්වීම් ලිවීම, පරීක්ෂාව, බෙදීම | 17,820.00 |
| 51 | 51 | ජාතික එලදායීතා සම්මාන උලෙලේ ඡායාරූප සකස් කර ලබාගැනීම - එච්.එම්. ගමගේ | 1,950.00 |
| 52 | 52 | 2023 වර්ෂය සඳහා සුළු මුදල් අග්‍රිමය අලුත් කිරීම | 1,000.00 |
| 53 | 53 | 2022 දෙසැම්බර් මස නිවාඩු දින සේවය වෙනුවෙන් වැටුප් ගෙවීම - කේ.පී. පත්මසිරි | 11,965.00 |
| 54 | 54 | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - කේ.පී. පත්මසිරි | 5,500.00 |
| 55 | 55 | රබර් මුද්‍රාවක් සකස් කිරීම - ඩබ්.ඒ.කේ. නිරෝෂ් | 700.00 |
| 56 | 56 | ප්‍රාදේශීය සභා රථවාහන අංගනයේ 2023 ජනවාරි මස විදුලි ගාස්තු ගෙවීම | 907.70 |
| 57 | 57 | පුවක්දණ්ඩාව පැරණි ආදාහනාගාරයේ 2022 දෙසැම්බර් මස විදුලි ගාස්තු ගෙවීම | 676.93 |
| 58 | 58 | පුවක්දණ්ඩාව ආදාහනාගාරයේ 2022 දෙසැම්බර් මස විදුලි ගාස්තු ගෙවීම | 1,702.57 |
| 59 | 59 | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් මස විදුලි ගාස්තු ගෙවීම | 1,061.64 |
| 60 | 60 | ප්‍රාදේශීය සභා රථවාහන අංගනයේ 2022 දෙසැම්බර් මස විදුලි ගාස්තු ගෙවීම | 1,061.54 |
| 61 | 61 | 2022 දෙසැම්බර් මස බෙලිඅත්ත පොදු වෙළඳපොල විදුලි ගාස්තු ගෙවීම | 14,436.93 |
| 62 | 62 | 2022 දෙසැම්බර් මස බස් නැවතුම පළමු මහල විවෘත පෙදෙසේ විදුලි ගාස්තු ගෙවීම | 4,061.54 |
| 63 | 63 | 2022 දෙසැම්බර් මස කාර්යාලයේ විදුලි ගාස්තු ගෙවීම | 51,163.08 |
| 64 | 64 | 2022 දෙසැම්බර් මස කාර්යාල වායු සමීකරණ පද්ධතියේ විදුලි ගාස්තු ගෙවීම | 66,982.57 |
| 65 | 65 | 2022 දෙසැම්බර් මස රථවාහන අංගනයේ ජල ගාස්තු ගෙවීම | 4,121.60 |
| 66 | 66 | 2022 දෙසැම්බර් මස කොම්පෝස්ට් වයාපෘතියේ ජල ගාස්තු ගෙවීම | 1,570.90 |
| 67 | 67 | 2022 දෙසැම්බර් මස පොදු වෙළඳපොල ජල ගාස්තු ගෙවීම | 25,711.32 |
| 68 | 68 | 2022 දෙසැම්බර් මසඩී.ඒ. රාජපක්ෂ ගොඩනැගිල්ලේ ජල ගාස්තු ගෙවීම | 42,691.77 |
| 69 | 69 | 2022 දෙසැම්බර් මස බෙලිඅත්ත මහජන වැසිකිළියේ ජල ගාස්තු ගෙවීම | 345.00 |
| 70 | 70 | 2022 දෙසැම්බර් මස පුවක්දණ්ඩාව පුස්තකාලයේ ජල ගාස්තු ගෙවීම | 4,425.58 |
| 71 | 71 | 2022 දෙසැම්බර් මස බෙලිඅත්ත බස් නැවතුම්පොල ජල ගාස්තු ගෙවීම | 2,042.40 |
| 72 | 72 | 2022 දෙසැම්බර් මස පුවක්දණ්ඩාව අදාහානාගාරයේ ජල ගාස්තු ගෙවීම | 3,199.68 |
| 73 | 73 | 2022 දෙසැම්බර් කාර්යාල අභ්‍යන්තර දුරකථන පද්ධතියේ ගාස්තු ගෙවීම | 413.84 |
| 74 | 74 | 2022 දෙසැම්බර් බෙලිඅත්ත මහජන පුස්තකාලයේ දුරකථන ගාස්තු ගෙවීම | 1,718.82 |

| | | | |
|---|---|---|---|
| 75 | 75 | 2022 දෙසැම්බර් කාර්යාල ෆැක්ස් දුරකථන ගාස්තු ගෙවීම | 4,014.91 |
| 76 | 76 | 2022 දෙසැම්බර් මස සභාපතිතුමාගේ රාජකාරී දුරකථන දීමනාව ගෙවීම | 13,947.60 |
| 77 | 77 | 2022 දෙසැම්බර් කාර්යාල දුරකථන හා ඉන්ටර්නෙට් ගාස්තු ගෙවීම | 18,450.89 |
| 78 | 78 | LL-6441 ටිපර් රථයට ඉන්ධන සැපයීම | 58,800.00 |
| 79 | 79 | නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම | 31,000.00 |
| 80 | 80 | ABV-0691 ත්‍රීරෝද රථයේ මීටර් කේබලය අලුතින් යෙදීම - සිල්වා සයිකල් වර්ක්ස් | 1,720.00 |
| 81 | 81 | ආදාහනාගාරයේ තණකොල කපන යන්ත්‍ර අලුත්වැඩියා කිරීම - බී.එම්.ඩබ්. සහබන්දු | 1,000.00 |
| 82 | 82 | 2023.01.16 මහා සභා රැස්වීම සඳහා සංග්‍රහ ද්‍රව්‍ය ලබාගැනීම - ඩබ්.එල්.ඩබ්. කොඩිතුවක්කු | 13,100.00 |
| 83 | 83 | කාර්යාලය සඳහා සංග්‍රහ ද්‍රව්‍ය ලබාගැනීම - චන්දිමාල් ෆෑට් සිටි | 4,750.00 |
| 84 | 84 | 2023 ස්ථිර සේවක වැටුප් ගෙවීම | 5,038,446.66 |
| 85 | 85 | සංවර්ධන අංශය සඳහා විදුලි පේනුවක් ලබාගෙන සවි කිරීම - ඩබ්.ඒ.කේ.එන්. දිල්හාන් | 1,480.00 |
| 86 | 86 | කාර්යාලයේ දොරවල් සඳහා ඉබි යතුරු ලබාගැනීම - සිට්නාමලුව හාඩ්වෙයාර් | 3,000.00 |
| 87 | 87 | කාර්යාල ප්‍රින්ටර සඳහා රිබන් 05 ක් ලබාගැනීම - සී/ස හම්බන්තොට දිස්ත්‍රික් සමූපකාර සමිතිය | 10,500.00 |
| 88 | 88 | 2023 වර්ෂයට ආහාර සාම්පල් ලබාගැනීමේ මහජන සෞඛ්‍ය පරීක්ෂක අත්තිකාරම් ගෙවීම | 12,000.00 |
| 89 | 89 | 2023 ජනවාරි මස දේපල ණය පොලී රජයේ දායකත්වය ගෙවීම | 9,721.73 |
| 90 | 90 | ගමන් වියදම් ගෙවීම - ඒ.ජී. සෙනරත් | 880.00 |
| 91 | 91 | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 6,200.00 |
| 92 | 92 | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ඉඩම මැනීමේ මිණුම් ගාස්තු ගෙවීම - මිනින්දෝරු අධිකාරි | 64,741.22 |
| 93 | 93 | 2022.12.23 සභා රැස්වීමට සංග්‍රහ ද්‍රව්‍ය ලබාගැනීම - පී.එස්. සමරවීර | 15,680.00 |
| 94 | 94 | කාර්යාලය සඳහා සංග්‍රහ ද්‍රව්‍ය ලබාගැනීම - චන්දිමාල් ෆෑට් සිටි | 7,410.00 |
| 95 | 95 | ආදාහානාගාරයට පිරවූ ගෑස් සිලින්ඩර් 05 ක් ලබාගැනීම - සිට්නාමලුව හාඩ්වෙයාර් | 93,250.00 |

***<u>ව්‍යාපෘති ගිණුම</u>***

| අ.අ | වවුචර් අංකය | කාරණය | මුදල රු. |
|---|---|---|---|
| 1 | 1 | LL-6441 ටිපර් රථය අලුත්වැඩියා කිරීම - චන්දන මෝටර්ස් | 52,500.00 |
| 2 | 2 | RF-0602 ට්‍රැක්ටර රථයේ ඉන්ධන ගාස්තු ගෙවීම | 71,850.00 |
| 3 | 3 | LX-0069 ගලි බවුසර් රථයේ ඉන්ධන ගාස්තු ගෙවීම | 42,000.00 |
| 4 | 4 | MG-330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයට 2022 නොවැම්බර් මස ඉන්ධන ගාස්තු ගෙවීම | 12,450.00 |
| 5 | 5 | RS-1233 බැක්හෝ යන්ත්‍රයේ ආදායම් බලපත්‍රය ලබාගැනීම | 8,120.00 |

***<u>කර්මාන්ත ගිණුම</u>***

| අ.අ | වවුචර් අංකය | කාරණය | මුදල රු. |
|---|---|---|---|
| 1 | 1 | කම්බුස්සාවල බටහිර ආරහේන මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - කම්බුස්සාවල බටහිර සමගි ගොවි සංවිධානය | 1,740,504.27 |
| 2 | 2 | පල්ලත්තර දකුණ කිවුල්වල ගෙදර මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - දම්මුල්ල නැගෙනහිර සාරභූමි ගොවි සංවිධානය | 1,784,434.81 |
| 3 | 3 | පල්ලත්තර මලපලාහේන මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - පල්ලත්තර නැගෙනහිර ගොවි සංවිධානය | 1,737,081.56 |
| 4 | 4 | දම්මුල්ල අලියවැටුනු ආර මාර්ගය 1 පටුමග ඉතිරි කොටස කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - දම්මුල්ල නැගෙනහිර සාරභූමි ගොවි සංවිධානය | 1,568,547.67 |
| 5 | 5 | බෙලිඅත්ත තැපැල් කන්තෝරුව අසලින් ඇති මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - කුඩාහීල්ල නැගෙනහිර ගොවි සංවිධානය | 751,314.61 |
| 6 | 6 | උඩුගල්මොටේ උඩිච්චිගෙවත්ත මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - උඩුගල්මොටේ දිලෙන තරු ගොවි සංවිධානය | 1,780,002.37 |
| 7 | 7 | සිට්නාමලුව බටහිර මහවත්ත පාර ඉතිරි කොටස කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - සිට්නාමලුව බටහිර පැරකුම් ගොවි සංවිධානය | 1,774,579.10 |
| 8 | 8 | දම්මුල්ල නැගෙනහිර නුගහේන්යාය මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - දම්මුල්ල නැගෙනහිර සාරභූමි ගොවි සංවිධානය | 1,787,448.39 |
| 9 | 9 | නිහිලුව හුලන්වත්ත මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - කෝංගලආර කහගහ අමුණ සාර ගොවි සංවිධානය | 1,981,632.02 |
| 10 | 10 | වැව්දත්ත වැව ඉහල මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - දෙද්දූවාවල නැගෙනහිර සමගි ගොවි සංවිධානය | 1,971,478.05 |
| 11 | 11 | පුවක්දණ්ඩාව පහලොස් බෝධිය 1 වන පටුමග කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - පුවක්දණ්ඩාව නැගෙනහිර එක්සත් ගොවි සංවිධානය | 1,931,624.74 |
| 12 | 12 | බෙලිඅත්ත පාලුවත්ත අසංග මහතාගේ සිවස අසල කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - පුවක්දණ්ඩාවඋතුර පැරකුම් ගොවි සංවිධානය | 1,172,992.49 |
| 13 | 13 | අඹගස්දෙනිය කරගහහේන මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - අඹගස්දෙනිය එකමුතු ගොවි සංවිධානය | 1,979,813.02 |
| 14 | 14 | පලපොත නැගෙනහිර දඹේආර මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - පලපොත නැගෙනහිර එක්සත් ගොවි සංවිධානය | 1,970,186.48 |

ඒ අනුව ඉහත අංක 09 (II) හි සභා ආවරණ අනුමැතිය යටතේ කළ ගෙවීම් ඇතුළු 2023 ජනවාරි මාසයේ ගෙවීම් කරන ලද සියළුම ගෙවීම් වාර්තා පිළිගැනීමට හා අනුමැතිය ලබා දීමට සුදුසු බව ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා යෝජනා කරන ලදුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පි.තිලක් කුමාර මහතා ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

**<u>09(III) මිළ ගණන් හා කමිටු වාර්තා පිළිගැනීම, ඇස්තමේන්තු හා වැඩ පිරිනැමීම අනුමත කිරීම.</u>**

**<u>09.(III) (අ) මිළ ගණන් හා මිළ කමිටු වාර්තා අනුමත කිරීම.</u>**

2023.02.06 දින මිල ගණන් කමිටුව

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන පෙර පාසල් වල ළමුන් සඳහා නිල ඇඳුමක් ලබා දීම සඳහා මිල ගණන් කැඳවන ලදුව,පහත සඳහන් ආයතන විසින් අප වෙත මිල ගණන් එවා ඇත.

| | සිල්ක් ග්‍රෙන්ඩ්,3/37, තංගල්ල පාර,බෙලිඅත්ත | මධුෂා ටේලර්ස්,තිස්ස පාර,නොටොල්පිටිය | ශාන් ටේලර්ස්,තිස්ස පාර,රන්න | ෂූ ලින්ක් ෆැෂන්,නො.160, සමන්,පලපොත ,බෙලිඅත්ත |
|---|---|---|---|---|
| ටී ෂර්ට් සහ කොට කලිසම(පෙර පාසල් ළමුන් සඳහා) කොට්න් | රු.1650.00 | රු.1400.00 | රු.1900.00 | රු.1825.00 |

මෙම මිල ගණන් අනුව පෙර පාසල් ළමුන් සඳහා නිල ඇඳුම් වෙනුවෙන් අඩුම මිලක් ඉදිරිපත් කර ඇත්තේ මධුෂා ටේලර්ස්,තිස්ස පාර,නොටොල්පිටිය ආයතනයෙනි. එම ආයතතයෙන් නිල ඇඳුම් 169 සකස් කර ලබා ගැනීමටත්, ගෙවීම් කිරීමටත් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදි.

2023.02.20 මිල ගණන් කමිටුව

<u>09.(III)(අ) I- කොම්පෝස්ට් හලර් යන්ත්‍ර දැල මිල දී ගැනීම</u>

| | | **ඕෂදී ග්ලාස් සෙන්ටර් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්,හක්මණ පාර,බෙලිඅත්ත** | **සිටිනාමලුව හාඩ්වෙයාර් ස්ටෝර්ස්,සිටිනාමලුව,තංගල්ල** | **ඉන්දික හාඩ්වෙයාර්, 53/A,වලස්මුල්ල පාර,බෙලිඅත්ත** |
|---|---|---|---|---|
| කොම්පෝස්ට් හලර් යන්ත්‍ර දැල අඩි 100 | මැස්කන් | රු.80,000.00 | රු.79,000.00 | රු.120,000.00 |
| | ටැප්කෝ | | | රු.80,000.00 |
| 1’’ බෝල්ට් ඇණ(වොෂර් 500) 250 | | රු.4,500.00 | රු.4,100.00 | රු.4,200.00 |

ඉහත මිල ගණන් අතරින් තත්වයෙන් උසස් මැස්කන් වර්ගයේ දැල් සහ අඟල් 01 ඇණ සඳහා අවම මිලක් ඉදිරිපත් කර ඇත්තේ සිටිනාමලුව හාඩ්වෙයාර් ස්ටෝර්ස් ,සිටිනාමලුව, තංගල්ල ආයතනයයි. එබැවින් එම ආයතනය වෙතින් මැස්කන් වර්ගයේ දැල් අඩි 100ක් හා අඟල් 01 ඇණ 250 ක් මිලදී ගැනීමටත් ගෙවීම් කිරීමටත් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී

**<u>09.(III)(අ) II- ඒරියල් බණ්ඩල් කනෙක්ටර් (බණ්ඩල් ටැප්) මිල දී ගැනීම</u>**

| | වන්නිආරච්චි ඉලෙක්ට්‍රිකල්ස් සහ ට්‍රාන්ස්පෝට්, නො.09, ඩී.ඒ.රාජපක්ෂ වෙළඳ සංකීර්ණය,බෙලිඅත්ත | පී.සංජීව ප්‍රදීප්(ඔරේන්ජ් අලෙවි නියෝජිත), ප්‍රදීප්,සිටිනාමලුව,බෙලිඅත්ත | කැලුම් ඉලෙක්ට්‍රිකල්ස්,59/A, තංගල්ල පාර,බෙලිඅත්ත |
|---|---|---|---|
| ඒරියල් බණ්ඩල් කනෙක්ටර් (35-70mm2) (ජෝඩු 50) | රු.1,050.00 | රු.790.00 | රු.1,160.00 |

මෙම මිල ගනන් අතුරින් අවම මිල ඉදිරිපත් කර ඇති පී.සංජීව ප්‍රදීප්(ඔරේන්ජ් අලෙවි නියෝජිත), ප්‍රදීප්,සිටිනාමලුව,බෙලිඅත්ත වෙතින් බණ්ඩල් ටැප් ජෝඩු 50 ක් ලබා ගැනීමටත්, ගෙවීම් කිරීමටත් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදි.

**09.(III)(අ) III- ප්‍රදර්ශන අල්මාරි (Show Case Cupboard) මිල දී ගැනීම**

| | | දම්රෝ,නො.10 6A,තංගල්ල පාර,බෙලිඅත්ත | දම්මික ට්‍රේඩ් සෙන්ටර් (පුද්) සමාගම ,වලස්මුල්ල පාර,බෙලිඅත්ත | චිත්‍රා ෆර්නිචර්, 66/A, තංගල්ල පාර, බෙලිඅත්ත |
|---|---|---|---|---|
| ප්‍රදර්ශන අල්මාරි (Show Case Cupboard) | 78cmx40cmx 197cm | රු.25,341.25 | | |
| | ඇල්ෆා Office coupboard | | රු.39,990.00 | |
| | 72''x32''x16'' | | | රු.42,500.00 |

මෙම මිල ගණන් අතුරින් අඩුම මිල ගණන් ඉදිරිපත්ව ඇත්තේ (78cm*40cm*197cm) ප්‍රමාණයේ අල්මාරිය සඳහා දම්රෝ ආයතනය විසින්ය.එබැවින් එම ආයතනයෙන් එම අල්මාරිය මිල දී ගැනීමටත්, ඒ සඳහා ගෙවීම් කිරීමටත් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදි.

මෙම ප්‍රසම්පාදන කමිටු තීරණ ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**09.III (ආ) ඇස්තමේන්තු හා වැඩ පිරිනැමීම අනුමත කිරීම, වැඩ අවසන් ව්‍යාපෘතීන් සඳහා මුදල් ගෙවීම**

**09.III (ආ) 1 - ඇස්තමේන්තු අනුමත කිරීම -**

**09.(III)(ආ) 1- I - කපුදූවආරවත්ත කොම්පෝස්ට් අංගනයේ පිවිසුම් මාර්ගය හා ගේට්ටුව අලුත්වැඩියා කිරීමේ ඇස්තමේන්තු අනුමත කිරීම .**
සිටිනාමලුව කපුදූවආර වත්ත කොම්පෝස්ට් අංගනයේ පිවිසුම් මාර්ගය හා ගේට්ටු අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් 770,924.32 ක මුදලක් ඇස්තමේන්තු කර තිබෙනවා.

ඒ අනුව සිටිනාමලුව කපුදූවආර වත්ත කොම්පෝස්ට් අංගනයේ පිවිසුම් මාර්ගය හා ගේට්ටු අලුත්වැඩියා කිරීම සඳහා වන රුපියල් 770,924.32 ක ඇස්තමේන්තුව සඳහා විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**09.(III)(ආ) 1-II- බණ්ඩරවත්ත පොල භූමියේ යකඩ බටකණු දිරාපත් වීම නිසා අලුත්වැඩියා කිරීම.**
බණ්ඩරවත්ත පොල භූමියේ යකඩ බට කණු දිරාපත් වීම නිසා එය අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් 59,250.95 ක මුදලක් ඇස්තමේන්තු කර තිබෙනවා.

ඒ අනුව, බණ්ඩරවත්ත පොල භූමියේ යකඩ බට කණු දිරාපත් වීම නිසා එය අලුත්වැඩියා කිරීම සඳහා වැයවන රුපියල් 59,250.95 ක ඇස්තමේන්තුව සඳහා විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**09.(III)(ආ) 1-III- බෙලිඅත්ත ප්‍රාදේශීය සභා පෙර පාසල් දරුවන් සඳහා ළමා පුටු 50ක් හා ළමා ඩෙස් 27 ක් ලබා දීම.**

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් දරුවන් සඳහා භාවිතා කිරීමට ළමා පුටු 50ක් සහ ළමා ඩෙස් 27ක් ලබා දෙන ලෙසට පෙර පාසල් ගුරුවරියන් විසින් ඉල්ලීම් කර තිබෙනවා.

ඒ අනුව ළමා පුටු 50ක් සහ ළමා ඩෙස් 27ක් මිල දී ගැනීම සඳහා විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**09.(III)(ආ)1-IV- පලපොත පුස්තකාලය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සහ එම පුස්තකාලයට උපකරණ මිලදී ගැනීම.**

<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>
පලපොත ග්‍රාම නිලධාරී වසමේ ආරම්භ කිරීමට යෝජිත පුස්තකාලය සඳහා පහත සඳහන් උපකරණ ලබා දීමට මා මේ ගරු සභාවටට යෝජනා කරන සිටිනවා. මෙම පුස්තකාලය ආරම්භ කිරීමට යෝජනා වී ඇත්තේ පසුගිය දිනවල දී ඉදිකරන ලද සේවා පියස නමැති ගොඩනැගිල්ලේ පුස්තකාලයක් සඳහා වෙන්කර ඇති භූමි ප්‍රමාණයේය. ඒ අනුව,

- මේස 01
- කියවීම් මේස 01
- පුටු 05
- අල්මාරි 02
- විදුලි පංකා 01

මෙම උපකරණ මිල දී ගැනීම සඳහා මා මේ සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා**
මෙම පුස්තකාලය තවම ආරම්භ කර නොමැති නිසාත් කිසියම් දිනෙක මෙම ගොඩනැගිල්ල ඔවුන් විසින් ඉවත් කළහොත් අදාල උපකරණ වලට වගකිව යුත්තෙක් නැහැ. එම නිසා වැනි මෙම උපකරණ ලබා දීමේ දී නෛතික එකඟතාවයක් තිබිය යුතුයි.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**
මෙම උපකරණ අප විසින් ලබා දෙන්නේ නීත්‍යානුකූල අදාළ ලියවිලි වල අත්සන් කිරීමෙන් අනතුරුවයි. එ වගේම මෙය පාලනය වන්නේ ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකු යොදවාය. එම නිසා මේ පිළිබඳව අපට වගකීමක් ගැනීමට පුළුවන්.

ඒ අනුව, පලපොත පුස්තකාලය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටත්, අනුමැතියෙන් පසු එම පුස්තකාලයට උපකරණ මිලදී ගැනීම සඳහා මහා සභාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

## 09..III (ආ) 2. වැඩ පිරිනැමීම අනුමත කිරීම. -

## 09.III (ආ) 3. වැඩ අවසන් ව්‍යාපෘතීන් සඳහා මුදල් ගෙවීම. –

## 10. වෙනත් කරුණු:-

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**
ඇල්දෙණිය ගම්වාසීන් විසින් රෙස්ටුරන්ට් එකක් සඳහා විරෝධය ප්‍රකාශ කර ලිපියක් එවා තිබෙනවා. එහි සඳහන් වන්නේ මෙම රෙස්ටුරන්ට් මුවාවෙන් ආරම්භ කිරීමට යන අරක්කු තැබෑරුම් සඳහා අවසර ලබා නොදෙන ලෙසයි. අපට පෙනී යන ආකාරයත් ගමක් මැදට රෙස්ටුරන්ට් එකක් අවශ්‍ය වන්නේ නැහැ. මුලින් මෙය රෙස්ටුරන්ට් එකක් මුවාවෙන් ආරම්භ කළත් පසුව මෙහි සිදුවන්නේ වෙනම ක්‍රියාදාමයක්. එම නිසා මේ සඳහා අපෙන් අවසර ලැබෙන්නේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා**
මේ සභාවේ සේවයේ නියුතු සෝමපාල මුණසිංහ යන අපගේ මිතුරා මාර්තු 7 දින විශ්‍රාම යාමට නියමිතයි. මෙතුමා සභාව පැවැත්වෙන සෑම දිනකදීම අපට සංග්‍රහ කටයුතු කිරීම සිදුකළා. ඔහු ඉතාමත් කැමැත්තෙන් සහ ඕනෑකමින් තමයි ඒ කටයුතු සිදු කළේ. ඒ නිසා එතුමාගේ විශ්‍රාමය දිවිය ඉතාමත් සතුටින් ගත කිරීම ලැබේවා යැයි මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විදාන ආරච්චිගේ උදය කුමාර මහතා**
සෝමපාල මුණසිංහ මහතා ඉතාමත් නිහතමානී මනුස්සයෙක්. ඔහු අපට සභාවට පැමිණි සෑම විටම හොඳින් සංග්‍රහ කටයුතු සිදු කිරීම සිදු කරනවා. ඔහු එය ඉතාමත් කැමැත්තෙන් තමයි සිදු කරන්නේ. එම නිසා එතුමාටගේ එතුමාගේ විශ්‍රාම දිවිය ඉතාමත් සතුටින් සහ නිරෝගීමත්ව ගත කිරීමට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා**
සෝමපාල මුණසිංහ මහතා අපේ ගමේ පුද්ගලයෙක්. ඔහු ගමේ අයත් සමඟත් කිසිම රණ්ඩුවක් නොමැතිව ඉතාමත් සාමකාමීව ජීවත් වන මනුස්සයෙක්. සභාවට පැවැත්වෙන සෑම දිනකදීම අපට සංග්‍රහ කටයුතු කිරීමට ඔහු උත්සාහ දරනවා. එතුමාගේ විශ්‍රාම යාම මේ මාර්තු මස 07 වැනිදාට යෙදී තිබෙන බැවින් එතුමාගේ විශ්‍රාම දිවිය ඉතාමත් සතුටින් ගත කිරීමට හැකිවේවා යැයි මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මානවඩුගේ කැලුම් ජානක මහතා**
එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් වශයෙන් එතුමාගේ විශ්‍රාම දිවිය සාර්ථව ගත කිරීම සඳහා අප එතුමාට සුභ පතනවා. මෙතුමා විශ්‍රාම ගියත් නැවතත් මේ සභාවට ඇවිත් මේ බෙලි අත්ත නගරයට ඇවිත් අපි සමග කතාබහ කර සතුටින් ජීවත් වන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම එතුමාගේ විශ්‍රාම දිවිය සාර්ථකව ගත කිරීමට හැකි වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

<u>**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**</u>

සෝමපාල මුණසිංහ කියන්නේ මගෙත් ඥාතිවරයෙක්. ඔහු මේ සභාවේ ඉතාමත් දීර්ඝ කාලයක් තම සේවා කටයුතු සිදු කලා. ඒ වගේම ඔහු අපත් සමඟ ඉතාමත් සතුටින් සහ ඉතාමත් ඕනෑකමින් තමයි ඔහුගේ කටයුතු සිදු කළේ. එතුමා මේ මාර්තු 9 විශ්‍රාම යාමට නියමිතයි. එතුමාගේ විශ්‍රාම දිවිය සාර්ථකව ගත කිරීම සඳහා මම එතුමාට සුබ පතනවා.

ඒ අනුව අද දිනට නියමිත සභාවේ වැඩ කටයුතු අවසන්ව ඇති බැවින්, මෙම සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීතුමන්ලාටත්, සභාවේ ලේකම් මහතා, කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදී මහත්මයන් ඇතුළු සැමට ස්තුති කරමින් සභාවේ කටයුතු අවසන් කරන ලදී.

ඒ අනුව ප.ව. 2.00 ට පමණ සභාවේ කටයුතු අවසන් කරන ලද අතර, මීලඟ සභා වාරය 2023.03.13 දිනට පැවැත්වීමට තීරණය කරන ලදී.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.